ආයතනයේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 182

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution : Ministry of Finance, Economic Stabilization and National Policies

Parliamentary Series : 182

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම	:	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	**182**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 182

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

පටුන

අනු අංකය	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුව	පිටු අංකය
1.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	1
2.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	15
3.	ශ්‍රී ලංකා රේගුව	24
4.	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	30
5.	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	34
6.	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව	37
7.	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව	38
8.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	40
9.	බදු අභියාචනා කොමිෂන් සභාව	49
10.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	51

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

සුරාබදු දෙපාර්තමේන්තුව
2022 අප්‍රෙල් 19

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>දේශීය හා විදේශීය මත්පැන්වල ප්‍රමිතිය</u> මහ ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිත කිරීම සඳහා දේශීය වෙළඳපොළ තුළ ඇති දේශීය හා විදේශීය මත්පැන්වල ප්‍රමිතිය සහතික කිරීම සම්බන්ධයෙන් සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සහ කාර්මික තාක්ෂණික ආයතනයේ සහායද ලබා ගනිමින් මත්පැන්වල ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කරන බව ගණන්දීමේ නිලධාරියා (ග.නි.) ප්‍රකාශ කළේය. මෙරට නිෂ්පාදිත දේශීය මත්පැන් මෙරට නිෂ්පාදිත විදේශීය මත්පැන් (Country made foreign liquor) සහ බියර් සඳහා මේ වන විට ප්‍රමිතීන් සකස් කර අවසන් බවත්, ලෝකයේ ප්‍රථම වරට කෘතිම රා සඳහා ප්‍රමිතියක් සකස් කිරීමේ පරීක්ෂණය ආරම්භකර ඇති බවත් ප්‍ර.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය. මෙයට අමතරව සුරාබදු නිලධාරීන් පුහුණු කිරීම, නීති විරෝධී මත්පැන් වැටලීම, මත්පැන් නිවාරණ ගම්මාන ඇති කිරීම සහ මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන හානි පිළිබඳ මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමද සිදු කරන බවත් ග.නි. ප්‍රකාශ කළේය.	මේ වනවිට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ඊට ඒකාබද්ධ කාර්මික තාක්ෂණ ආයතනය හා එහි විද්වත් පිරිසක් විසින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ප්‍රතිශෝධිත ස්ප්‍රිතු මධ්‍යසාර , අරක්කු, බියර් සහ දේශීයව නිෂ්පාදනය කරනු ලබන සියලුම විදේශ මත්පැන් සඳහා නිශ්චිත ප්‍රමිතීන් හඳුන්වා දී ඇත. මෙම ප්‍රමිතීන් පිළිබඳව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සියලුම මත්පැන් නිෂ්පාදකයින් දැනුවත් කිරීම් සිදු කර ඇත. මේ වනවිට ඒ පිළිබඳව ගත යුතු නෛතික ක්‍රියාමාර්ග හා ක්ෂේත්‍ර පරීක්ෂණ අඛණ්ඩව සිදු කරමින් පවතී. මහ රා සඳහා වූ ප්‍රමිතීන් සකස් කිරීම පිළිබඳ පර්යේෂණය මේ වනවිට ඉතාමත්ම සාර්ථකව සිදු කරමින් පවතී. මෙම ප්‍රමිතීන් ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු හා සාකච්ඡා අදාල අංශ සමඟ පවත්වමින් සිටියි. ඊට අමතරව මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් නිෂ්පාදන අලෙවි කිරීමේදී වෙළඳපොල ඒකාධිකාරයක් ඇති කිරීම සඳහා කටයුතු කිරීම වැළැක්වීමට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිසි පියවර ගෙන ඇති අතර ඒ සඳහා සියලුම මත්පැන් නිෂ්පාදකයින් හා අලෙවි කරන ස්ථාන සඳහා උපදෙස් මූලස්ථාන කාර්යාලය මඟින් නිකුත් කිරීමට කටයුතු කර ඇත.
<u>මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ආරම්භ කිරීමට බලාපොරොත්තුවන රසායනාගාරය</u> රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් (COPA) ලබා දුන් නියෝගයක් අනුව මත් ද්‍රව්‍යවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් 2021 වසරේ ස්ථාපනය කිරීමට අපේක්ෂා කළද එය සිදු කිරීමට නොහැකි වූ බවත්, මෙම වර්ෂයේ (2022) එය ඉටු කිරීමට කටයුතු කරන බවත් ප්‍ර. ග. නි./ ග.නි. ප්‍රකාශ කළේය. එසේම මේ සඳහා වැයවන අධික පිරිවැය සපුරා ගැනීමේ දුෂ්කරතාවය මෙම ප්‍රමාදයට හේතු වූ බවද ඔහු ප්‍රකාශ කළේය. මුදල් අමාත්‍යාංශයේ	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අංග සම්පූර්ණ රසායනාගාරයක් ඉදි කිරීම සඳහා 2023 අයවැය මඟින් රුපියල් මිලියන 100 ක් වෙන් කරන ලදී. මේ වනවිට එම රසායනාගාරය ස්ථාපිත කිරීම පිළිබඳ තත්වය පහත පරිදි වේ. 1) ගොඩනැඟිල්ල හඳුනා ගන්නා ලදී. 2) එහි කොටස් වෙන් කිරීම (Partition) සඳහා ප්‍රසම්පාදනය අවසන් කර ඇත. 3) රසායනාගාරය සඳහා උපදේශකත්වය සඳහා පළමු

අනුමැතිය ඇතිව සුරාබදු දෙපාර්තමේන්තුව සතු ත්‍යාග අරමුදලින් (Reward Fund) මේ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට අදහස් කරන බවද ප්‍ර.ග.නි./ ග.නි. වැඩි දුරටත් ප්‍රකාශ කළේය. මෙම රසායනාගාරය ස්ථාපනය කිරීමෙන් ප්‍රමිතියෙන් යුත් මත්පැන් වෙළඳ පොළට නිකුත් කිරීමේ සහ නීති විරෝධී මත්පැන් සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමේ හැකියාව ලැබෙන බව ඔහු අනාවරණය කළේය.	සාකච්ඡා වටය පවත්වන ලදී. 4) අදාල T.O.R. (Team of Reference) සකස් කිරීම සඳහා කටයුතු කර ඇත. 5) ඒ අනුව ව්‍යාපෘතිය සම්බන්ධ ඉදිරි පියවර ගනිමින් පවතී.
<u>2022 වර්ෂයේ 1 වන කාර්තුවේ කාර්ය සාධනය</u> 2021 සහ 2022 වර්ෂවල පළමු කාර්තුව සැසඳීමේදී ආසන්න වශයෙන් පිළිවෙලින් රු. බිලියන 37 ක සහ 42 ක ආදායමක් ලබා ඇති බවත්, ඒ අනුව මෙම වර්ෂයේ ආදායමේ පැහැදිලි වර්ධනයක් දැකිය හැකි බවත් ග.නි. පෙන්වා දුන්නේය. බදු අනුපාත වැඩි කිරීම මගින් ආදායම වැඩි වීමට යම් බලපෑමක් ඇති වුවද, නිෂ්පාදනයේ සහ ආදායමේ වර්ධන වේගය පිළිවෙලින් 9% සහ 17% කින් වැඩි වී ඇති බව ග.නි. වැඩි දුරටත් සඳහන් කළේය. මේ වන විට මෙරටට එතනෝල් ආනයනය කිරීම නතර කර ඇති බව කාරක සභාවේ දී අනාවරණය විය. එසේම වර්තමානයේ පවතින ඉන්ධන අර්බුදය නිසා රටේ පවතින ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් මත්පැන් නිෂ්පාදනය සඳහා අවශ්‍ය පරිපාක ස්ප්‍රිතු නිපදවීමට අවශ්‍ය උක්ගස් ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනාගාර වෙත නොලැබෙන බැවින් යම් අර්බුදකාරී තත්වයක් උද්ගත වී ඇති බවද මෙහිදී සඳහන් විය. එවැනි ගැටලුකාරී තත්වයන් ඇති නොවේ නම් මත්පැන් නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් පරිදි පරිපාක ස්ප්‍රිතු මෙරටදී නිෂ්පාදනය කළ හැකි බවද කාරක සභාවේදී අනාවරණය විය.	2022 වර්ෂයේ පැවති ඉන්ධන අර්බුදයත් නිෂ්පාදනාගාරයන් වෙත උක්ගස් ප්‍රමාණවත් පරිදි නොලැබීමත් බධ ඉරිඟු ආනයනය නතර කිරීම හා ඩොලරය ඉහළ යාම මත ආනයන වියදම වැඩිවීම වැනි හේතුද ස්ප්‍රිතු නිෂ්පාදනයේදී අහිතකරව බලපා ඇත. එවැනි ගැටළු ඇති නොවුවහොත් ආනයනයකින් තොරව දේශීයව නිෂ්පාදනය කරන පරිපාක, පොල් හා තල් ස්ප්‍රිතු දේශීය මත්පැන් නිෂ්පාදනයට යොදා ගත හැකි අතර, වර්තමානයේ ඇතැම් ස්කාගාරවල ස්ප්‍රිතු අතිරික්තයක්ද පවතී. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත මත්පැන් අවශ්‍යතාවය සපුරාලිය හැකි ස්ප්‍රිතු නිෂ්පාදනයක් දේශීයව නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. තව දුරටත් දේශීය ස්ප්‍රිතු නිෂ්පාදනය වැඩිකල යුතු අතර නිෂ්පාදිත ස්ප්‍රිතුවල ගුණාත්මක බවද වර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ඒ සඳහා ස්කාගාරවල තාක්ෂණික පහසුකම් වර්ධනය කිරීමක් මෙන්ම ස්ප්‍රිතු නිෂ්පාදනයට යොදවන අමුද්‍රව්‍ය ප්‍රමාණයේ වැඩි කිරීමක් අත්‍යාවශ්‍ය වේ.
<u>තනතුරු පුරප්පාඩු</u> 2021.12.31වන දිනට දෙපාර්තමේන්තුව තුළ සුරාබදු නියාමක තනතුරු 102 ක් ඇතුළුව පුරප්පාඩු 352 ක් පැවතීම. **<u>නිර්දේශ</u>** සුරාබදු දෙපාර්තමේන්තුව, රාජ්‍ය ආදායමට වැඩිම දායකත්වයක් සපයන ප්‍රධාන රාජ්‍ය ආයතන තුනෙන් එකක් බව පෙන්වා දුන් කාරක සභාව රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා සේවක පුරප්පාඩු පිරවීම අත්‍යාවශ්‍ය කරුණක් බැවින් අදාල පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් ක්‍රියා මාර්ග ගන්නා ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කළේය. එසේම වර්තමානයේ නීති විරෝධී මත්පැන් අලෙවිය වැඩිවීමේ ප්‍රවනතාවයක් ඇති වීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ඉලක්ක	මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත. **ජ්‍යෙෂ්ඨ මට්ටම** (I) සුරාබදු අධිකාරි තනතුරට සීමිත පදනම මත තනතුරු 08 ක් සඳහා බඳවාගැනීමට 2023 ජූලි මස විභාග දෙපාර්තමේන්තුව මගින් සීමිත තරඟ විභාගයක් පවත්වන බව දන්වා ඇත. (II) නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු සඳහා උසස් කිරීමට අදාල අයදුම් පත් කැඳවීමට අවශ්‍ය කටයුතු කර ඇත. (III) රා.ප.ව. 22/19 අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2022.12.31 දිනට සහකාර සුරාබදු කොමසාරිස්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්,සුරාබදු කොමසාරිස් හා අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් යන තනතුරු වල

ලබා දෙමින් නීති විරෝධී මත්පැන් / මත් ද්‍රව්‍ය වැටලීම් කිරීමට ක්‍රියා කරන බවත් දෙපාර්තමේන්තුව තුල පවතින නිලධාරී හිඟය නිසා මෙම කටයුතු ඉටුකර ගැනීමේ දුෂ්කරතා මතු වී ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය.	නිලධාරීන් විශ්‍රාම ගැනීම හේතුවෙන් 25ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් ඉතිරි වූයේ නිලධාරීන් 08 ක් පමණි. එබැවින් සහකාර සුරාබදු කොමසාරිස් නිලධාරීන් 04ක් සඳහා නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් පූර්ණ කාලීන වැඩ බැලීම / රාජකාරි ඉටුකිරීම සඳහා පත්වීම් ලබාදෙන ලදි. එසේම සුරාබදු අධිකාරි නිලධාරීන් අතරින් පුරප්පාඩු වූ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 10ක් සඳහා පූර්ණ කාලීනව රාජකාරි ඉටුකිරීමට නිලධාරීන් පත්කරන ලදි. අදාල පත්වීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. (IV) සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා සුදුසු නිලධාරියෙක් ලබාදෙන ලෙස මගේ අංක ED/02/03/18 හා 2021.10.27 හා 2022.01.06 දිනැති ලිපිවලින් මුදල් අමාත්‍යාංශ ලේකම් මගින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත.ඒ අනුව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නව බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවේ දී නිලධාරියෙකු අනුයුක්ත කරන බව දන්වා ඇත. (V) නීති නිලධාරි තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නිලධාරියෙකු තෝරා ගෙන ඇති අතර ජාතික අයවැය චක්‍රලේඛ 04/2022 අනුව බඳවාගත නොහැකිය. නමුත්, රාජ්‍ය සේවයේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වූ අංක CP/DCE/23 හා 2023.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීති නිලධාරී බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. **තෘතීය මට්ටම** (I) ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 21 ක් සඳහා නිලධාරීන් උසස් කිරීම සඳහා 2023.02.24,25 සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. (II) රාජ්‍ය සේවයේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වූ අංක CP/DEC/23 හා 2023.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සුරාබදු පරීක්ෂක තනතුරු 49ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. අදාළ විවෘත බඳවා ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් 2023 ජූලි මස තුලදී

	විභාගය පැවැත්වීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. **ද්විතීය මට්ටම** (I) සුරාබදු සැරයන් තනතුරු 36ක පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලැබී ඇත. සීමිත බඳවා ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් 2023 ජූලි මස විභාගය පැවැත්වීමට කටයුතු කරන බව දන්වා ඇත. (II) පුරප්පාඩු පවතින සුරාබදු නියාමක තනතුරු 111 ක් බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවයේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වූ අංක CP/DEC/23 හා 2023.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලැබී ඇත.අදාල විවෘත තරහ විභාගය 2023 ජූලි මස විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන බව දන්වා ඇත. (III) දැනට පුරප්පාඩු පවතින රාජ්‍ය කළමනාකාර සේවා නිලධාරී තනතුරු 16ක් සහ සංවර්ධන නිලධාරී තනතුරු 01ක් සඳහා කඩිනමින් නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කිරීමට මුදල් අමාත්‍යාංශ ලේකම් මඟින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත. **ප්‍රාථමික මට්ටම** සුරාබදු නියාමක රියදුරු තනතුරු 15ක පුරප්පාඩු පවතින අතර එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සඳහා රාජ්‍ය සේවයේ අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් වූ අංක CP/DEC/23 හා 2023.02.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලැබී ඇත.
<u>පරිගණක දත්ත පද්ධතියේ වර්තමාන තත්වය</u> සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධවන පරිගණක දත්ත පද්ධතියේ වර්තමාන තත්වය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග කාර්තු වශයෙන් දත්ත හුවමාරු කර ගන්නා බවත්, ශ්‍රී ලංකා රේගුව මඟින් ආනයන අපනයන තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බවත් ග.නි. ප්‍රකාශ කළේය. <u>නිර්දේශ</u> පරිගණක දත්ත පද්ධතිය සකස් කිරීම සම්බන්ධයෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර	සකස් කිරීමට යෝජිත සුරාබදු දෙපාර්තමේන්තු ආදායම් කළමණාකරණ පද්ධතියේ (Revenue Administration System of Excise Department – RASED) පහත පරිදි වේ. 1. මෘදුකාංග අවශ්‍යතා හඳුනා ගැනීමේ වාර්තාවේ කෙටුම්පත (Software Requirements Specifications – SRS) සකස් කර ඇත. 2. එම SRS වාර්තා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මඟින් සනාථ කිරීමේ කටයුතු සඳහා යොමු කර ඇති අතර (Signed off) ඊට සමගාමීව එම කටයුතුවලට මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා සේවා

ඇති කාල රාමුව අනුව 2023 වර්ෂයේ ජනවාරි වන විට එහි කටයුතු අවසන් කිරීමට ක්‍රියා කරන ලෙසත් මේ සඳහා මොරටුව හෝ කොළඹ විශ්ව විද්‍යාලයේ සහාය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළේය.	දායකයෙකු සපයා ගැනීමට ඉදිරි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. 3. මෙහිදී දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා හැකිතාක් දුරට හඳුනා ගැනීම සිදු කළ යුතුව ඇත. ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් යොමු කිරීමට අවැසි බවත් එසේ කිරීමෙන් නිරන්තර පද්ධති අවශ්‍යතා වෙනස්වීම් (Change Requests) අවම කර ගත හැකි වේ.
<u>ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතිය</u> මත්පැන් බෝතල් සහ මත්පැන් බෝතල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ආරක්ෂිත ස්ටිකර් කළමනාකරණ පද්ධතිය සූරාබදු දෙපාර්තමේන්තුව මගින් මේ වන විට ක්‍රියාත්මක කිරීම පිළිබඳව කාරක සභාව සිය අවධානය යොමු කළේය. ස්ටිකරයේ සත්‍යතාවය හඳුනා ගැනීම සම්බන්ධයෙන් මහජනතාවට භාවිත කලහැකි යෙදවුමක් (APP) සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇති බවත් කඩිනමින් එම කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය. එසේම මෙම ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමත් සමග නිෂ්පාදනයේ සහ සූරාබදු ආදායමේ වැඩි වීමක් දැකිය හැකි බව ඔහු වැඩි දුරටත් පැහැදිලි කළේය.	පාරිභෝගිකයන්ට මත්පැන්වල නිරවද්‍යතාවය පරීක්ෂා කර බැලීමට සකස් කර ඇති ජංගම මෘදුකාංගය 2022.08.27 වන දින හඳුන්වා දුන් අතර එය Android මෙහෙයුම් පද්ධතිය සඳහා Google Play Store මගින් බාගත කර ගත හැකි අතර IOS මෙහෙයුම් පද්ධතිය සඳහා Appstore මගින් බාගත කර ගත හැකි ය. ඉහත මෘදුකාංගය මගින් ශ්‍රී ලංකාවට ආනයනය කර විකිණීමට තබා ඇති සියළුම ආනයනික මත්පැන්වල හා දේශීය මත්පැන්වල නිරවද්‍යතාවය හා ඒ සම්බන්ධ තොරතුරු දැනගත හැකිය.
<u>මත්පැන් අපනයනය මත සූරාබදු අවකරණය</u> මත්පැන් අපනයනය මත අයකර ගනු ලබන බදු මුදලින් එම නිෂ්පාදන අපනයනය කිරීමේදී 2021 වර්ෂයේදී රු.3,689,638,848 ක සූරාබදු මුදලක් අවකරණයකර තිබීම කාරක සභාව නිරීක්ෂණය කළේය. එසේම සූරාබදු අවකරණය පිළිබඳ තොරතුරු ගිණුම් අංශය තුල පවත්වා ගෙන ගොස් නොතිබීම හේතුවෙන් දළ ආදායම පිළිබඳ විස්තර නොමැති බවත් , ශුද්ධ බදු ආදායම පමණක් ගිණුම්ගත වන බවත් මෙහිදී අනාවරණය විය. එම නිෂ්පාදන අපනයනය කල බවට තහවුරු කිරීම සඳහා ඉහත කී ඒකාබද්ධ පරිගණක දත්ත පද්ධතියේ වැදගත්කම කාරක සභාව තව දුරටත් අවධාරණය කළේය. මෙවන විට ශ්‍රී ලංකා රේගුව හා සම්බන්ධ (Link) වී අදාල දත්ත ලබා ගන්නා බවත් ගිණුම් ලේඛනවල පවතින වැරදීම් සහ දුර්වලතා නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ වුවද රට තුල පවතින ඩොලර් අර්බුදයට පිලියම් ලෙස ශ්‍රී ලංකාව විසින් මත්පැන් අපනයනය කිරීම තව දුරටත් ප්‍රවර්ධනය කිරීමේ	අපනයනය කරනු ලබන මත්පැන් මත බදු අවකරණයට අදාළව ගිණුම් තැබීමේ ක්‍රම වේදය සකස් කරමින් ඇත. මේ සඳහා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරමින් ඇති අතරම 2023 වර්ෂයේදී විගණනය පෙන්වා දී ඇති පරිදි ගිණුම් අංශය තුළ ලේඛන පවත්වා ගෙන යමින් කටයුතු කළ හැකි වෙතැයි අපේක්ෂා කරමි. විදේශ මත්පැන් සහ දේශීයව නිපදවන මත්පැන් සහ රසායනාගාර පරීක්ෂණ සඳහා ශ්‍රී ලංකා සූරාබදු දෙපාර්තමේන්තුවට අංග සම්පූර්ණ රසායනාගාරයක් ඉදි කිරීම සඳහා 2023 අයවැය මඟින් රුපියල් මිලියන 100 ක් වෙන් කරන ලදි. මේ වනවිට එම රසායනාගාරය ස්ථාපිත කිරීම පිළිබඳ තත්වය පහත පරිදි වේ. 1) මේ වනවිට ගොඩනැඟිල්ල හඳුනා ගන්නා ලදී. 2) එහි කොටස් වෙන් කිරීම (Partition) සඳහා ප්‍රසම්පාදනය අවසන් කර ඇත. 3) රසායනාගාරය සඳහා උපදේශකත්වය සඳහා පළමු සාකච්ඡා වටය පවත්වන ලදී. 4) T.O.R. (Team of Reference) සකස් කිරීම

වැදගත්කම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. ආනයනික මත්පැන් සඳහා ලේඛන පරීක්ෂා කිරීම පිළිබඳවත්, විදේශ මත්පැන් සහ දේශීයව නිෂ්පාදනය කරන මත්පැන්වල රසායනාගාර පරීක්ෂා කිරීම් සිදු කිරීම පිළිබඳවත් කාරක සභාව විසින් විමසන ලදි. මත්පැන් මෙරටට ආනයනය කරන අවස්ථාවේදී අදාළ ආනයනික ලේඛන පරීක්ෂා කරන බවත් සන්නාම අනුමැතියක් (Brand Approval) ලබා ගැනීමෙන් පමණක් එම මත්පැන් දේශීය වෙළඳ පොළෙහි අලෙවි කිරීමට අවසර ලබා දෙන බවත් ප්‍ර.ග.නි/ ග.නි. විසින් පැහැදිලි කරන ලදි. එසේම දේශීයව නිෂ්පාදනය කරන විදේශීය මත්පැන් සාම්ප්‍රදායික ක්‍රම වේදයකින් තොරව නිෂ්පාදනය කරන්නේ නම් ඒවා (Emulated Foreign Liquor) කාණ්ඩය යටතේ වෙළඳ පොළට නිකුත් කරන බවත් ඒ අනුව දේශීය නිෂ්පාදකයා සාම්ප්‍රදායික ක්‍රමයන්ට අනුගතව විදෙස් මත්පැන් නිෂ්පාදනය කිරීමේ නැඹුරුවක් දක්නට ලැබෙන බවත්.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය.	සඳහා කටයුතු කර ඇත. 5) ඒ අනුව ව්‍යාපෘතිය සම්බන්ධ ඉදිරි පියවර ගනු ලබමින් පවතී.
<u>පානීය නොවන මධ්‍යසාර ආනයනයේදී සිදුවන අක්‍රමිකතා</u> පානීය නොවන මධ්‍යසාර මෙරටට ආනයනය කිරීමේදී කිලෝ ග්‍රෑම්වලින් ගණනය කළද මෙරට ගණනය කිරීම් සිදු කරනු ලබන්නේ පරිමාව මත පදනම්ව ලීටර් වලිනි. කෙසේ නමුත් පරිසර උෂ්ණත්වය අනුව පරිමාව වෙනස් වන අතර විදේශයන්හි ශීත දේශගුණය තුළ ඇති පරිමාවට වඩා මෙරට දී එම පරිමාව වැඩි වීමක් සිදුවන බවත් මෙම අතිරේක පරිමාවෙන් ආනයනකරු වංචනිකව ලාභ ලැබිය හැකි බවත් පෙන්වා දුන් කාරක සභාව ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ප්‍ර.ග.නි. වෙත උපදෙස් දෙන ලදි.	07/2018 දරන පානීය නොවන ස්ප්‍රිතු සඳහා වූ සුරාබද්ද මැයෙන් වූ සුරාබදු නිවේදනයෙහි 3(i) වගන්තිය අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් සුරාබදු ආඥා පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ හැර එහි (I)වන උපලේඛනයේ සඳහන් පානීය නොවන ස්ප්‍රිතු වර්ගයක් කිසිම තැනැත්තෙකු විසින් ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බව සඳහන් කර ඇත. තවද මෙම මෙම නිවේදනයේ 5 වන වගන්තිය අනුව මෙම නිවේදනය වගන්ති හා කොන්දේසි මෙන්ම මෙම නිවේදනය යටතේ නිකුත් කර ඇති බලපත්‍ර හා අවසරපත්‍රවල සඳහන් කොන්දේසි කඩ කළහොත් ඒ සඳහා සුරාබදු ආඥා පනතේ 48 හෝ 56 යන වගන්ති යටතේ කටයුතු කල යුතු බවද දක්වා ඇත. ඒ අනුව 2.8 හි පළමු ඡේදයෙහි සඳහන් සියලු ආයතන වෙත පානීය නොවන ස්ප්‍රිතු ආනයනය කිරීම, ගබඩා කිරීම හා තොග වශයෙන් විකිණීම සඳහා සුරාබදු බලපත්‍ර නිකුත් කර ඇත. එම ආයතන විසින් සුරාබදු නිවේදන 07/2018 හි හා බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩකරමින් පානීය නොවන ස්ප්‍රිතු ආනයනය කිරීම සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා

	ඉදිරිපත් කර ඒ සඳහා සමථ මුදල් අයකර එම බහාලුම් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.
<u>රත්නපුර රා තැබෑරුමේ ටෙන්ඩරය</u> රත්නපුර අංක 01 තැබෑරුම සඳහා නියම කරන ලද ටෙන්ඩරය මුදලට වඩා අඩු මුදලකට ටෙන්ඩර නොකැඳවා ටෙන්ඩරය ලබාදීම සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් පත් කරන ලද කමිටුවක් විසින් ගනු ලැබූ තීරණයක් මත රු. 28,000,000/-මුදලකට එම තැබෑරුම ලබා දුන් බව ප්‍ර.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය. තවද, එම මුදලට හෝ ටෙන්ඩරය ලබා නොදුන්නේ නම් එම ප්‍රදේශයේ නීති විරෝධී මත්පැන් අලෙවිය වැඩි වන බවත්, රජයට එකී රු. 28,000,000/- ආදායම පවා අහිමි වන බවත් ඔහු වැඩි දුරටත් පැහැදිලි කළේය.	උක්ත රා තැබෑරුම සුරාබදු කොමසාරිස් ජනරාල්තුමාගේ තක්සේරු මුදල වූ රු. 46,084,120.00 වටිනාකමට ටෙන්ඩර් ඉදිරිපත් නොවීම නිසා නැවත ටෙන්ඩර් කැඳවන ලදි. එම අවස්ථාවේදී ද සුරාබදු කොමසාරිස් ජනරාල්තුමාගේ තක්සේරුවට කිසිදු ටෙන්ඩර් කරුවෙක් ඉදිරිපත් වී නැත. ප්‍රාදේශිය ලේකම් විසින් සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ලිඛිතව කළ දැනුම් දීම පරිදි ටෙන්ඩරය සඳහා ඉහලම මිල ඉදිරිපත් කරන ලද එල්. ඒ. අමරරත්න හා කේ.ඒ.පී. සෝමරත්න යන දෙදෙනාට මෙම රා තැබෑරුම රුපියල් 32,000,000.00 ක මුදලකට පැවරීමට අනුමැතිය ප්‍රාදේශීය ලේකම් වෙත සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ලිඛිතව දන්වා ඇත. නමුත් එම මුදලට ද රා තැබෑරුම ගැනීමට අදාළ පුද්ගලයින් අකමැත්ත ප්‍රකාශ කරමින් අභියාවනයක් ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධව සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් මගින් ටෙන්ඩර්කරුවන්ගේ අභියාවනාවල සඳහන් කරුණු හා රජයේ ආදායම පිළිබඳව සලකා බලා මෙම ටෙන්ඩරය රු. 28,000,000.00 කට පිරිනැමීමට තීරණය කර සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිතව දන්වා ඇත. ඒ අනුව රත්නපුර අංක 01 රා තැබෑරුම එල්.ඒ. අමරරත්න හා කේ.ඒ.පී. සෝමරත්න යන අයට ප්‍රාදේශීය ලේකම් විසින් ගිවිසුම් අත්සන් කර බලපත්‍රය ලබා ගෙන ඇත. එහිදී ප්‍රධාන වශයෙන් කමිටුව පහත කරුණු සම්බන්ධයෙන් සලකා බලන ලද බව දක්වා ඇත. එනම්, රා තැබෑරුම් සඳහා පවතින තරගකාරිත්වය කලින් කලට වෙනස් මුහුණුවරක් ගැනීම 2020 වර්ෂය සඳහා වැඩිම මිල ගණන් ඉදිරිපත් කර ඇති එකම පාර්ශවය වීම සහ ඒ සඳහා වෙනත් තරගකරුවන් ඉදිරිපත් නොවීම යන කරුණුද රා රේන්දය 2020 වසරට විකිණීමක් නොවීමෙන් ලබා ගත හැකි රාජ්‍ය ආදායම අහිමිවීමේ හැකියාව, රා රේන්දය විකිණීමක් නොවීමෙන් ප්‍රදේශයේ නීති විරෝධී මත්පැන් නිෂ්පාදන හා අලෙවිය ප්‍රවර්ධනයට ඇති හැකියාව යන සියළුම කරුණු සහ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුව හා අයදුම්කරුගේ ලන්සුව යන දෙකෙහි මධ්‍ය වටිනාකම වන රු. 28,000,000.00 ක මිලකට මෙම ටෙන්ඩරය

	පිරිනැමීම සුදුසු බව නිර්දේශ කර ඇති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. එසේම 2021, 2022 වර්ෂවල නැවත ටෙන්ඩර් කිරීමේ දී විකිණීමක් සිදු නොවූ සියළුම රා තැබෑරුම් සහ විදේශ මත්පැන් තැබෑරුම් මුදල් ඇමතිතුමාගේ අනුමැතිය ලබාගෙන සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ තක්සේරුවෙන් පොදු ප්‍රතිශත අගයක් අඩුකර රා තැබෑරුම් විකිණීමට කටයුතු කර ඇත. එබැවින් මෙම ගැටළුව මේ වන විට විසඳී ඇත.
<u>බීඩි නිෂ්පාදනය සඳහා බදු අයකර ගැනීම නිර්දේශ</u> බීඩි නිෂ්පාදනය සඳහා යම්කිසි බදු මුදලක් රජයට ගෙවීමට ඇතැම් බීඩි නිෂ්පාදකයින් කැමැත්ත පළ කර ඇති බව කාරක සභාවේ දී අනාවරණය විය. ඒ අනුව එම බදු මුදල් රජයට අයකර ගත හැකි වැඩ පිළිවෙලක් සකස්කිරීම පිලිබඳ අවධානය යොමු කරන ලෙස කාරක සභාව නියෝග කළේය.	බීඩි නිෂ්පාදනය සඳහා 2023 ජනවාරි මස 01 වනදා සිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම බීඩියක් සඳහාම රු. 2.00 ක අනුප්‍රමාණයට දුම්කොළ බද්දක් අය කිරීමට රජය මගින් 2022 12.31 දිනැති 1999 අංක 08 දරණ දුම්කොළ බදු පණත යටතේ නිවේදනයක් නිකුත් කර ඇත.
<u>සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතිය</u> සුරාබදු ආදායම් ගණනය කිරීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අයවැය හා පරිපූරක ප්‍රතිපාදන මගින් රු.මිලියන 87.2 ක් වෙන්කර තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව එකිනෙකට සම්බන්ධ කරන පරිගණක දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබන බව ප්‍ර.ග.නි/ ග.නි. පැහැදිලි කළේය.	දෙපාර්තමේන්තුව විසින් සකස් කිරීමට යෝජිත සුරාබදු දෙපාර්තමේන්තු ආදායම් කළමණාකරණ පද්ධතියේ (Revenue Administration System of Excise Department – RASED) පහත සඳහන් ප්‍රගතිය මේ වන විට අත් කරගෙන ඇත. 1. මෘදුකාංග අවශ්‍යතා හඳුනා ගැනීමේ වාර්තාවේ කෙටුම්පත (Software Requirements Specifications – SRS) සකස් කර ඇත. 2. එම SRS වාර්තා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මඟින් සනාථ කිරීමේ කටයුතු සඳහා යොමු කර ඇති අතර (Signed off) ඊට සමගාමීව එම කටයුතුවලට මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා සේවා දායකයෙකු සපයා ගැනීමට ඉදිරි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. 3. මෙහිදී දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා හැකිතාක් දුරට හඳුනා ගැනීම සිදු කළ යුතුව ඇති බැවින් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් යොමු කිරීමට අවැසි බවත් එසේ කිරීමෙන් නිරන්තර පද්ධති අවශ්‍යතා වෙනස්වීම් (Change Requests) අවම කර ගත හැකි වේ.
<u>මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් වෙළඳපොළ ඒකාධිකාරියක් ඇති කිරීම වැළැක්වීම</u> ඇතැම් මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් වෙළඳපොළ ඒකාධිකාරියක් ඇති කිරීමට කටයුතු කිරීම වැළැක්වීමට_දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ගත් ක්‍රියා මාර්ග	සියලුම සිල්ලරට විකුණන බලපත්‍ර ස්ථානවල සියලුම නිෂ්පාදකයින්ගේ මත්පැන් තිබිය යුතු බවට සුරාබදු කොමසාරිස් ජනරාල්තුමා විසින් වක්‍රලේඛයක් මගින් දැනුවත්කර ඇත.

සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධව විශේෂ අධ්‍යයනයක් සිදුකර ඒ සඳහා යෝජනාවලියක් මූදල් අමාත්‍යාංශය වෙත ලබා දුන් බවත් මෙම තත්වය වළක්වාලීම සඳහා අවශ්‍ය වක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය.	
<u>**මත්පැන්වල සැර බැලීමේ උපකරණ කට්ටල සහ මිනුම්සරා මිලදී නොගැනීම**</u> ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් වූ නමුත් මේ දක්වා මත්පැන්වල සැර බැලීමේ උපකරණ කට්ටල 814 ක් සහ මිනුම් සරා 138 ක් මිළදී නොගැනීම. වර්තමානයේ රට තුල පවතින තත්වය තුල මේ උපකරණ මිළදී ගැනීමේ දුෂ්කරතාවයක් පවතින බව ප්‍ර.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ නමුත් මීට පෙර මිළදී ගත් උපකරණ නියමිත ප්‍රමිතීන්ට අනුව අලුත්වැඩියා කරමින් සිටින බවත් මේ වන විට සෑම නිෂ්පාදනාගාරයකම සැර බැලීම සහ ප්‍රමිතිගත කිරීම සිදුවන බවත් ප්‍ර.ග.නි/ ග.නි. වැඩි දුරටත් ප්‍රකාශ කළේය	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත ප්‍රාදේශීය කාර්යාල , ප්‍රධාන කාර්යාලයේ සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය යටතේ පවතින ස්කාගාර, ගුදම් හා මත්පැන් නිෂ්පාදනාගාර සඳහා අවශ්‍ය සැර බැලීමේ උපකරණ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. මේ සඳහා නව මිලදී ගැනීම් කිරීමට ප්‍රසම්පාදන කටයුතු 2020 පෙබරවාරි මස ආරම්භ කළද පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ මූල්‍ය කටයුතු සඳහා වූ ගැටලු හේතුකොටගෙන එම කටයුතු ප්‍රමාද විය. දේශීයව මෙම උපකරණ මිලදී ගැනීමට නොමැති වූ අතර ඒවා ආනයනය කිරීමට සිදුව ඇත. වෙළඳපොළේ පැවති විකල්ප උපකරණ සුරාබදු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ට නොගැළපෙන බව ද ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් වාර්තා කර තිබුණි. ශ්‍රී ලංකා සුරාබදු නිලධාරී කණ්ඩායමක් රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ පුහුණුවක් ලබා දෙපාර්තමේන්තුව සතු උපකරණ නැවත භාවිතයට ගතහැකි පරිදි ප්‍රමිතිකරණය සිදු කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට ඇති අවශ්‍යතාවය මැනවින් කළමණාකරණය කර ඇත.
<u>**රත්නපුර අංක 1 සහ 2 රා තැබෑරුම්වලින් රා සාම්පල් පරීක්ෂාකර නොතිබීම**</u> පළාත් සභාකාර සුරාබදු කොමසාරිස් සහ සුරාබදු අධිකාරීන් විසින් අදාළ පළාත තුළ වෙළඳාම පිණිස තබා ඇති රා බෝතල්වලින් සාම්පල් තුන් මසකට වරක්වත් රජයේ රස පරීක්ෂක වෙතින් පරීක්ෂා කරගත යුතු වුවත් රත්නපුර අංක 1 සහ 2 රා තැබෑරුම්වලින් 2017 ඔක්තෝබර් මාසයෙන් පසු 2020 වර්ෂය වන තෙක්ම එසේ පරීක්ෂා කර නොතිබීම. මෙම රා තැබෑරුම් සම්බන්ධයෙන් යම් යම් අඩුපාඩු තිබූ බව පිළිගන්නා බවත් මේ වන විට සුරාබදු කොමසාරිස්වරයා නිකුත් කරන ලද වක්‍ර ලේඛයක් අනුව මාස තුනකට වරක් රා නියැදිවල (sample) අදාල පරීක්ෂා කිරීම් සිදුකරන බවත් ප්‍ර.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය. කෙසේ නමුත් රස පරීක්ෂක වාර්තා ලැබීමට පෙර එම රා අලෙවිය සිදුවන බැවින් ඇතැම් විට	රාවල පවතින ප්‍රමිතිය නියාමනය කිරීමේ දුර්වලතා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් පැහැදිලිව හඳුනාගෙන ඇති අතර, සමස්ත අවශ්‍යතාවය අනුව සිදුකල යුතු රා සැපයුම සඳහා අවශ්‍ය පොල්ගස් ප්‍රමාණය, මදින්නන්ගේ සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනය කර ඇත. එසේම රාවල ප්‍රමිතිය සකස් කිරීම සම්බන්ධව පර්යේෂණයක් ආරම්භ කර ඇති අතර, එම පර්යේෂණය සඳහා වූ පළමු පියවර අවසන්ව ඇත. කෙසේ නමුදු පර්යේෂණයේ දෙවෙනි පියවර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග ආරම්භකර ඇති අතර, එහි පළමු අධ්‍යයනයන් හා පරීක්ෂණයන් අවසන් කර ඇත. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ රසායනාගාරය පිහිටුවීම පිළිබඳ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

ප්‍රමිතියෙන් තොර රා පාරිභෝගිකයා අතට පත්වීමට ඉඩ ඇති බව පැහැදිලි කල කාරක සභාව, රාවල ප්‍රමිතිය නියාමනය කිරීමේ දුර්වලතා පවතින බව පෙන්වා දුන්නේය. මෙම තත්වය පිළිගත් ප්‍ර.ග.නි/ ග.නි. විසින් ඉදි කිරීමට අපේක්ෂිත මධ්‍යම සුරාබදු රසායනාගාරය මගින් මෙම තත්වය වළක්වා ගැනීමට හැකි බවත් ඒ සඳහා එම රසායනාගාරය ඉතා ඉක්මනින් ඉදි කිරීමේ අවශ්‍යතාවයේ වැදගත්කමත් පත්වා දෙන ලදි.	
<u>පානීය නොවන ස්ප්‍රිතු ආනයනය සඳහා තාවකාලික බලපත්‍රයක් නිකුත්කර තිබීම</u> භාණ්ඩ ආනයනය හා ප්‍රවාහනය සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් නොමැති පුද්ගලික සමාගමක් විසින් රු.5,168,570/- ක වටිනාකමකින් යුත් පානීය නොවන ස්ප්‍රිතු ආනයනය සඳහා තාවකාලික බලපත්‍රයක් නිකුත්කර තිබීම පිළිබඳ කාරක සභාව කරුණු විමසීය. එම ස්ප්‍රිතු රේගුවෙන් නිදහස් කර ගැනීමට එම තාවකාලික බලපත්‍රය ලබා දීමට කටයුතු කළ බවත් ඒ සඳහා රු.500,000/- දඩ මුදලක් සහ අදාළ බදු අය කර ගත් බවත් ප්‍ර.ග.නි/ ග.නි. ප්‍රකාශ කළේය.	සුරාබදු නිවේදන 07/2018 හි හා බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩකරමින් පානීය නොවන ස්ප්‍රිතු ආනයනය කිරීම සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කර ඒ සඳහා සමථ මුදල් අය කිරීමට කටයුතු කර ඇත.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම

2022 ජුනි 15

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ආදායම් පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)</u>	අතුරු මුහුණතක් මගින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා ඇති සුරාබදු දෙපාර්තමේන්තුවේ දත්ත මාර්ගගත ක්‍රමයට යොමු කරමින් සිටී. මේ වන විට සුරාබදු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය හරහා ආනයන අපනයන තොරතුරු ලබා ගැනීමටත් අවශ්‍ය අනුමැතියන් online මගින් ලබා දීමටත් කටයුතු කරනු ලබයි.
<u>සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජනා</u> • එතනෝල් හා ඉන්ධන හිඟය නිසා සිදු වන ආදායම් අහිමි වීම එතනෝල් හිඟය නිසා දිනකට රු.මිලියන 50-100 ක් රජයට අහිමි වන බව සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කල අතර ඒ සඳහා පහත දැක්වෙන පිළියම් යෝජනා කරන ලදි.	2022 වර්ෂයේ පෙබරවාරි, මාර්තු මාසය වන විට ආරම්භ වූ එතනෝල් හිඟය මේ වන විට බොහෝ දුරට පහව ගොස් ඇත. ඒ අනුව 2022 වර්ෂයේ පැවති එතනෝල් හිඟය මේ වන විට යහපත් මට්ටමකට පැමිණ ඇති බව නිරීක්ෂණය වේ. ❖ මොලැෂස් ආනයනය මේ වන විට අවශ්‍ය නොවන බව පෙනී යයි.

- මොලෑස් හා ඉරිහු ආනයනය කිරීමට රාජ්‍ය ආයතන 2ට අවසර ලබා දීම - ආරක්ෂිත තොගයක් (buffer stock) පවත්වා ගෙන යාම සඳහා එතනෝල් ආනයනයට අවසර ලබා දීම - ඉරිහු ඇට ටොන් 15,000 -20,000 ක ප්‍රමාණයක් ආනයනය කිරීමට අවසර ලබා දීම - ඉරිහු හා උක් වගාවන් සඳහා ප්‍රමාණවත් පොහොර සපයා දීම - මත්පැන් බෝතල් නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය සැපයීම	❖ බඩ ඉරිහු නිෂ්පාදනයට පැමිණි බාධා යම් තරමකට පහව ගොස් ඇති බව පෙනේ. ❖ පොහොර සැපයීම යම් මට්ටමකට යහපත් වී ඇත. ❖ මත්පැන් බෝතල් නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍ය ආනයනය හෝ එකතු කර ගැනීම පිළිබඳ ගැටළු සාකච්ඡා වෙමින් පවතී. කෙසේ වුවද, මේ වන විට එතනෝල් නිෂ්පාදනාගාර තුළ යහපත් තත්වයක් පවතින බව වාර්තා කරමි.
<u>මත්පැන් අලෙවි සැල් අන්තර් සම්බන්ධ කිරීමේ ප්‍රගතිය</u> නියමිත කාලය තුළ එම ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ඇති බවත්, අවශ්‍යතා එක් රැස් කිරීමට හා අවදානම් හඳුනා ගැනීමට කටයුතු කර ඇති බවත් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.	RASED ව්‍යාපෘතිය හරහා සියලු මත්පැන් අලෙවි සැල්වල දෛනික අලෙවි කිරීම් සම්බන්ධ ප්‍රගතිය ලබා ගැනීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ මූලික අවස්ථාවේ පවතී.
<u>රා බලපත්‍ර සඳහා ලබා දී ඇති බදු සහන හේතුවෙන් අහිමි වී ඇති ආදායම</u> රා බලපත්‍ර සඳහා ලබා දී ඇති බදු සහන හේතුවෙන් දිනකට රු. මිලියන 400ක ආදායමක් සුරාබදු දෙපාර්තමේන්තුවට අහිමි වීම. ආදායමින් 93%ක් උපයනු ලබන්නේ සමාගම් 6ක් විසින් හා ආදායමින් 7%ක් සමාගම් 15ක් විසින් උපයනු ලබන බව මෙහිදී අනාවරණය විය. එසේම 2022 ජනවාරි 03 වැනිදා සිට මත්පැන් බෝතල් සඳහා ස්ටිකර් හඳුන්වා දීම මගින් වංචා වැළැක්වීමට පියවර ගෙන ඇති බව සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. ඊට අමතරව ජංගම යෙදුම් හරහා යම් බදු ගෙවන්නෙකු බදු ගෙවා නිබෙද යන්න මහජනයාට දැනගත හැකිවන බවද ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කළේය. ස්ටිකර් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ඉන්දියානු සමාගමේ පවතින යම් තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් ජංගම යෙදුම් ව්‍යාපෘතිය අවසන් කිරීම ප්‍රමාද වී ඇති බවත්, මෙම ව්‍යාපෘතිය හඳුන්වා දීමෙන් පසු රා බලපත්‍ර ආදායම තුන් ගුණයකින් වැඩි වීම හේතුවෙන් 17% කින් ආදායම වැඩි වී ඇති බවත් කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.	2021.01.07 දිනැති 3/2021 සුරාබදු නිවේදනය අනුව මහ රා තොග ලීටරයක් සඳහා රු.25ක් වූ සුරා බද්ද 2022 .04. 29 සු.නි.03/2022 යටතේ රු.50 දක්වා ඉහල නංවා ඇත. 2021 වර්ෂයට සාපේක්ෂකව 2022 වර්ෂයේ රා නිෂ්පාදනය හා ආදායම ඉහල යාමක් වාර්තාවේ. රා බෝතල් නිෂ්පාදනයේදී සෙසු මත්පැන් නිෂ්පාදනයේදී මෙන්ම නිෂ්පාදන අවස්ථාවේදීම ආරක්ෂිත ස්ටිකර් ඇලවීම සිදුවේ.

2022 ජූලි මස 01 වැනිදා සිට ආනයන මත්පැන් බලපත්‍ර ක්‍රියාවලිය මෙම ජංගම යෙදුම හරහා පරීක්ෂා කිරීමට පහසුකම් සලසන බව කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. **<u>නිර්දේශ</u>** - ස්ටිකර් ව්‍යාපෘතිය හාර ඉන්දියානු සමාගමට ගෙවීම් නැවැත්වීම හා ගිවිසුම ප්‍රකාරව අවශ්‍ය පියවර ගැනීම.	
<u>රා සඳහා ප්‍රමිතීන් නියම කිරීම</u> ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණ අයතනය හා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව රා සඳහා ප්‍රමිතිය නියම කිරීම සඳහා පියවර ගන්නා බව කාරක සභාවේ විමසුමට පිළිතුරු දෙමින් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික තාක්ෂණ අයතනය හා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව රා සඳහා ප්‍රමිතීන් නියම කිරීමට පියවර ගනිමින් සිටී.
<u>කෘතිම රා තහනම් කිරීම</u> කෘතීම රා තහනම් කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අවශ්‍ය බවත්, මනුෂ්‍ය ශරීරයට අහිතකර රා පරිභෝජනය එමගින් නතර වනු ඇති බවත් සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. සෑම මත්පැන් වර්ගයක් සඳහාම ප්‍රමිතීන් මේ වන විට නියම කර ඇතැයිද ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කළේය. **<u>නිර්දේශ</u>** - නිෂ්පාදනයේ ගුණාත්මකභාවය මිනිස් ශරීරයට අහිතකර නොවන බවට සහතික වීම - කෘතීම රා නිෂ්පාදනය අධෛර්යමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම හා ස්වාභාවික රා ප්‍රවර්ධනනය කිරීම.	ඉහත සඳහන් පරිදි රා සඳහා ප්‍රමිතීන් සැකසීමට ක්‍රියා මාර්ග ගෙන ඇති නිසා රා සඳහා ප්‍රමිතීන් සැකසීමෙන් හා කෘතිම රා සම්බන්ධ ග්‍රහන කටයුතු පුලුල් කිරීම මගින් මෙම ගැටලුව විසඳා ගැනීමට හැකිවනු ඇත.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කැඳවූ විශේෂ කාරක සභා රැස්වීම

2022 ජූනි 16

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය</u> බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම හා ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු මූලික වශයෙන්	සුරාබදු දෙපාර්තමේන්තුව මේ දක්වා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සමග සම්බන්ධ වී නැත. සුරාබදු දෙපාර්තමේන්තුවේ යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය (RASED) මගින් මෙම පහසුකම් සලසා ගත යුතු බව හඳුනා ගෙන ඇත.

වැදගත් වන ආයතන 5ක් සමග දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සම්බන්ධ කොට තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම. මෙම පරිගණක පද්ධතිය සකස් කිරීම සඳහා ශ්‍රීලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන (ICTA) සමග ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව ගිවිසුම්ගත වී වෙනත් බාහිර ආයතනයක් හරහා (outsource) එම පද්ධතිය සකස් කරවා ගෙන ඇති බවත්, එම පද්ධතිය භාවිතා කිරීමේදී විශාල වශයෙන් වැරදි සිදුවන බවත් , පරිශීලක හිතකාමී (user friendly) නොවන බැවින් එම පද්ධතිය අතහැරදැමූ බවත් ග.නි. ප්‍රකාශ කළාය. එමෙන්ම, පද්ධතිය තම දෙපාර්තමේන්තුව වෙත භාර දීමෙන් පසු ඇති වූ ගැටළු / දුෂ්කරතා පිළිබඳව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත දන්වා සිටියද අවශ්‍ය වැඩි දියුණු කිරීම් සිදු වී නොමැති බවද ඇය වැඩි දුරටත් ප්‍රකාශ කළාය. එමෙන්ම, මේ වන විට එස්තෝනියානු රජයෙන් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රදානයක් ලැබීමට නියමිත බවත්, ඒ සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ ඉල්ලා ඇති බවත් ඇය සඳහන් කළාය. <u>නිර්දේශ</u> - භාණ්ඩ ආනයනය හා අපනයන ක්‍රියාවලියේදී සිදුවන වංචා, දූෂණ හා අක්‍රමිකතා වැළැක්වීම සඳහා අදාළ ආයතන අතර ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීම. - ආනයනය හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, මෙම පද්ධතිය මඟින් ඒකාබද්ධ කිරීමට අපේක්ෂිත ආයතන හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2022 ජුනි මස 16 වැනි දින කාරක සභාව හමුවට කැඳවීමට - එදින මෙම පද්ධතියේ උද්ගත වී ඇති ගැටළු / දුර්වලතා හඳුනා ගෙන එම පද්ධතිය වැඩි දියුණු කිරීමට ගත හැකි පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට	
<u>සුරාබදු දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය</u>	දෙපාර්තමේන්තුවේ නව පරිගණක පද්ධතිය ස්ථාපිත කල පසු මෙම සංවර්ධනයන් සිදු

මත්පැන්,වෙළඳසැල්, පොලිස් ස්ථාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි සෑම පාර්ශවයක්ම සම්බන්ධ වන ආකාරයට මෙම පද්ධතිය සකස්වෙන බවත්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය, සුරාබදු හා බදු පරිපාලනය, මත්පැන් බෙදා හැරීම, සැපයුම, දාම නියාමනය, අපරාධ හා නීති කළමනාකරණය, වාර්තා නිකුත් කිරීමේ පහසුව මෙන්ම අවදානම් කළමනාකරණය ආදී සෑම ක්ෂේත්‍රයක්ම මෙමගින් ආවරණය වන බව සුරාබදු දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. <u>නිර්දේශ</u> - දැනට සුරාබදු බලපත්‍ර අනුමැතිය දෘඩ පිටපතක් ලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්වෙන බවත්, එම අනුමැතිය මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් විය යුතු බව.	කිරීමට ක්‍රියාකරනු ලබයි. සකස් කිරීමට යෝජිත සුරාබදු දෙපාර්තමේන්තු ආදායම් කළමණාකරණ පද්ධතියේ (Revenue Administration System of Excise Department – RASED) ප්‍රගතිය පහත පරිදි වේ. 1. මෘදුකාංග අවශ්‍යතා හඳුනා ගැනීමේ වාර්තාවේ කෙටුම්පත (Software Requirements Specifications – SRS) සකස් කර ඇත. 2. එම SRS වාර්තා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මඟින් සනාථ කිරීමේ කටයුතු සඳහා යොමු කර ඇති අතර (Signed off) ඊට සමගාමීව එම කටයුතුවලට මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා සේවා දායකයෙකු සපයා ගැනීමට ඉදිරි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. 3. මෙහිදී දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා හැකිතාක් දුරට හඳුනා ගැනීම සිදු කළ යුතුව ඇත. ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් යොමු කිරීමට අවැසි බවත් එසේ කිරීමෙන් නිරන්තර පද්ධති අවශ්‍යතා වෙනස්වීම් (Change Requests) අවම කර ගත හැකි වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
නො. 353, කෝට්ටේ පාර, රාජගිරිය.

දෙපාර්තමේන්තුවේ නම : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **182**

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
2022 ජූනි 08

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ආනයනය සඳහා බලපත්‍ර ලබා දීම</u> නිර්දේශිත කාලය ඉක්මවූ වාහන, කොටස් කර ගෙන්වනු ලබන වාහන සහ මත්පැන් නිෂ්පාදනය සඳහා වන ස්ත්‍රිතු ආදිය සඳහා බලපත්‍ර ලබාදීමේ ප්‍රතිපත්තිය <u>නිර්දේශ</u> - 2018 – 2020 දක්වා කාලය තුළ දෙපාර්තමේන්තුව මගින් මත්පැන්/ස්ත්‍රිතු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය, බලපත්‍ර ලබා දී ඇති කාණ්ඩ, බලපත්‍ර ලබා දී ඇති සමාගම්, මාසයකට ගෙන්වනු ලබන ප්‍රමාණ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් මසක් තුළ ප්‍ර.ග.නි./ග.නි විසින් කාරක සභාවට ඉදිරිපත් කිරීම. - මත්පැන්/ස්ත්‍රිතු බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය අවභාවිත කිරීම වැලැක්වීම සඳහා නිසි ප්‍රතිපත්තියක් ප්‍ර.ග.නි./ග.නි විසින් සකස් කිරීම. - ඖෂධ නිෂ්පාදනය සඳහා ගෙන්වන ස්ත්‍රිතු එම කාර්යය සඳහාම යොදා ගන්නේද යන්න සම්බන්ධයෙන් නිසි පසු විපරමක් / සුපරීක්ෂාවක් ප්‍ර.ග.නි./ග.නි විසින් හඳුන්වාදීම. - වාහන හා කොටස් හා ස්ත්‍රිතු ආනයනය සඳහා බලපත්‍ර ලබා දීමේ දී නිසි පිළිගත් ප්‍රතිපත්තියක් ප්‍ර.ග.නි. / ග.නි. විසින් මාස 04 ක් තුළ සකස් කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම හා ස්ත්‍රිතු සඳහා ආනයන බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය සැකසීමේදී සුරාබදු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් එම කටයුත්ත සිදු කිරීම.	ස්ත්‍රිතු ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේ ප්‍රතිපත්තිය, 2018 – 2020 දක්වා කාලය තුල බලපත්‍ර ලබා දී ඇති කාණ්ඩ, බලපත්‍ර ලබා දී ඇති සමාගම්, මාසයකට ආනයනය කරනු ලබන ප්‍රමාණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව අංක MFO6/4/COPA/Export.Dept හා 2022.09.05 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. වාහන හා කොටස් සඳහා බලපත්‍ර ලබා දීමට අදාළව පාලක ජනරාල් විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිය හා මත්පැන්/ස්ත්‍රිතු බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය හා ප්‍රතිපත්තිය ඇතුළත් වාර්තාව අංක MFO6/4/COPA/Export.Dept හා 2022.09.05 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

<u>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය</u> බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම හා ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළු මූලික වශයෙන් වැදගත් වන ආයතන 5ක් සමග දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සම්බන්ධ කොට තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම. <u>නිර්දේශ</u> - භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලියේ දී සිදු වන වංචා, දූෂණ හා අක්‍රමිකතා වැළැක්වීම සඳහා අදාළ ආයතන අතර ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීම. - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, මෙම පද්ධතිය මගින් ඒකාබද්ධ කිරීමට අපේක්ෂිත ආයතන හා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 2022 ජූනි මස 16 වැනි දින කාරක සභාව හමුවට කැඳවීමට. - එදින මෙම පද්ධතියේ උද්ගත වී ඇති ගැටළු / දුර්වලතා හඳුනාගෙන එම පද්ධතිය වැඩි දියුණු කිරීමට ගත හැකි පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට.	ඇමරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක EXBS වැඩසටහන මගින් ප්‍රදානයක් ලෙස ලැබීමට නියමිත තොරතුරු පද්ධතිය ලබා ගැනීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023.01.23 දින ලබා දී ඇත. 2023 අප්‍රේල් මාසයේ සිට එහි වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) 2022 ජූනි 16 දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සඳහා කැඳවා තිබුණි. එහිදී ලැබුණු නියෝගය පරිදි මෙම දෙපාර්තමේන්තුව සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පරිගණක පද්ධතියට අදාළ විස්තරාත්මක වාර්තාවක් 2022.10.26 වන දින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
<u>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන විවිධ පාර්ශ්ව වෙත පැවරීම</u> ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කරනු ලබන වාහන පසුව විවිධ පාර්ශ්ව වෙත පැවරීම යටතේ 2011 හා 2012 වසරවල ආනයනය කරන ලද වාහන 589 ක් විය. ඒ අතුරින් (අ) පළමු ලියාපදිංචියේ සිට වාහනය වෙනත් අයෙකුගේ නමින් ලියාපදිංචි වී ඇති අවස්ථා 159 ක්, (ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසර 5 ක්	ත්‍යාග ක්‍රමය යටතේ නිකුත් කරනු ලබන ආනයන පාලන බලපත්‍රයේ පහත සඳහන් කොන්දේසි ඇතුළත් කරනු ලැබේ. • වාහනය, බලපත්‍ර නිකුත් කළ නමට ලියාපදිංචි කළ යුතුය. • මෙම වාහනය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ දින සිට වසර පහක් (05) යන තෙක් විකිණීම, වෙනත් පාර්ශ්වයකට පැවරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමක් නොකළ යුතුය. • වාහනය දකුණු පසින් පැදවීම සිදු කළ යුතුය. • බලපත්‍රය හර කරන අවස්ථාවේ අදාළ සියලු අතිරේක ගාස්තු බලපත්‍ර ලාභියා විසින් ගෙවිය යුතුය.

ඉකුත් වීමට පෙර වාහන වෙනත් අයෙකුට විකිණීම හෝ පැවරීමේ අවස්ථා 34 ක්, (ඇ) 2012.09.30 දින වන විට ආනයනය කරන ලද වාහනවලින් මෙතෙක් ලියාපදිංචි නොකළ වාහන 115 ක්, (ඈ) වාහනයේ ලියාපදිංචි අයිතිය හිමි බලපත්‍රලාභියාගේ නමින්ම වාහන පැවරීමේ කොන්දේසිය ඉවත් කර ඇති වාහන 27 ක් පැවතුනි. නිවැරදි ලෙස කොන්දේසි සහිතව බලපත්‍රලාභියාගේ නමින්ම නිවැරදිව ලියාපදිංචි කර ඇති වාහන ගණන 254 ක් විය. <u>ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය කිරීමේ දී සම්බන්ධ වන ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම</u> ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, එම වාහන ආනයනය සිදු කරනු ලබන රේගු දෙපාර්තමේන්තුව හා එම වාහන ලියාපදිංචි කරනු ලබන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර මනා සම්බන්ධීකරණයක් තිබිය යුතු වුවත්, එම සම්බන්ධීකරණය නොමැති වීම. <u>නිර්දේශ</u> - මෙලෙස ත්‍යාග ක්‍රමය යටතේ ආනයනය කරන වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් පසුව එම ක්‍රියාදාමය පසුවිපරම් / නියාමනය සඳහා වැඩපිළිවෙලක් ප්‍ර.ග.නි ./ ග.නි. විසින් සකස් කරන ලෙස - එම වාහන ආනයනය කිරීමෙන් පසු යම් අක්‍රමිකතාවයක් සිදු වී ඇත්නම් නියමිත බදු ප්‍රමාණය අය කර ගැනීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට අදාළ ආයතන සමග සම්බන්ධීකරණයෙන් වැඩපිළිවෙලක් ප්‍ර.ග.නි ./ ග.නි. විසින් මාසයක් තුළ සකස් කොට කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස	• වාහනය පස්/මඩවලින් තොර විය යුතු අතර එය තහවුරු කිරීමට සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. • වායු සමනය සහිත වාහනයක් නම් CFC වායුව සහිතව භාවිතය සඳහා අවසර ලබා නොදෙනු ලැබේ. • බලපත්‍රය හර කරන අවස්ථාවේ දී ජපන් වාහන තක්සේරු ආයතනය / Bureau Veritas විසින් නිකුත් කරන ලද අපනයන පරීක්ෂණ සහතිකය ඉදිරිපත් කළ යුතුය. මෙවැනි මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමේ සහතිකයේ අදාළ කොන්දේසි සඳහන් කළ යුතු අතර එවැනි කොන්දේසි සටහන් කරමින් ලියාපදිංචි සහතිකයක නිකුත් කරයි. මේ අනුව ත්‍යාග ක්‍රමය යටතේ ගෙන්වන ලද වාහනයක ලියාපදිංචි සහතිකය අදාල කොන්දේසිවලට යටත්ව ඇති බැවින් අවුරුදු 05ක කාලයකට පෙර නැවත වෙනත් පාර්ශවයක් නමින් ලියාපදිංචියක් සිදු කිරීමේ හැකියාවක් නැත. මුල් ලියාපදිංචියේ සිට වසර 05ක් ඉක්මවීමෙන් පසු වෙනත් පාර්ශවයක් වෙත අදාල වාහනය පැවරීමක් කරන විට රේගු බදු අය කිරීමට යටත්ව වාහනය පැවරීම සම්බන්ධව මෙම දෙපාර්තමේන්තුවේ විරුද්ධත්වයක් නොමැති බවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත දන්වා යවනු ලැබේ. ඒ අනුව අදාල රේගු බදු ගෙවීම තහවුරු කර ගනිමින් අනතුරුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් අදාල වාහනය වෙනත් පාර්ශවයක් වෙත පැවරීම සිදු කරනු ලැබේ. දැනට පවතින තොරතුරු තාක්ෂණ පහසුකම් තුළ මේ වනවිට ASYCUDA පද්ධතිය හරහා ශ්‍රී ලංකා රේගුව සමග මාර්ගගත ක්‍රමය මගින් සම්බන්ධ වී ඇත. එමෙන්ම ශ්‍රී ලංකා රේගුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමග මාර්ගගතව සම්බන්ධ ව ඇති බැවින් ද්විත්ව පරීක්ෂාවක් සිදු වේ. තව දුරටත් මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමට අපේක්ෂිත නව e - බලපත්‍ර ක්‍රමය හරහා මෙම ආයතන එකිනෙකට සම්බන්ධ කරනු ලැබේ.
<u>ප්‍රමිතියට පටහැනිව වාහන ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් නොකිරීම</u> 1978 අංක 28 දරණ පනතින් සංශෝධිත 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11ඊ වගන්තිය ප්‍රකාරව ප්‍රමිතියට පටහැනිව ආනයනය සිදු කරන	නීතිපති දෙපාර්තමේන්තුව විසින් අප වෙත යොමු කර ඇති අංක ඒ/207/2022 හා 2023.01.03 දිනැති ලිපිය අනුව, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත මගින් බලතල ලැබී ඇති නමුත් එවැනි ආනයනකරුවන්ගේ ව්‍යාපාර/සමාගම් ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත නෛතික

ආනයනකරුවන් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් නොකිරීම. <u>නිර්දේශ</u> - ප්‍රමිතියට පටහැනිව ආනයනය සිදු කරන ආනයනකරුවන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාණවත් නොවන බැවින් ඒ වෙනුවට එම ආනයනකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට ප්‍ර.ග.නි./ග.නි විසින් කටයුතු කිරීම. - ප්‍රමිතියට පටහැනිව ආනයනය කරන ආනයනකරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්මත කිරීම සඳහා ප්‍ර.ග.නි./ග.නි විසින් මාස 3 ක් තුළ කටයුතු කර කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.	බලතල ලබා දී නොමැති බව අප වෙත දැනුම් දී ඇත.
<u>මෝටර් කාර් රථ 33 ක් වැරදි රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ ආනයනය කිරීම හේතුවෙන් රු.මිලියන 114.6ක රේගු බදු අහිමි වීම</u> 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 1933/13 දරණ ගැසට් පත්‍රයේ ප්‍රතිපාදනවලට අනුව හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හා රාජ්‍ය අමාත්‍යවරයා විසින් ආනයන හා අපනයන පාලකවරයා වෙත දෙන ලද උපදෙස්වලට පරිබාහිරව 2017 වර්ෂයේ දී පාවිච්චි කළ මොටර් කාර් රථ 33ක් වැරදි රේගු සංයෝජිත වර්ගීකරණය අංක යටතේ ආනයනය කිරීම හේතුවෙන් රු. මිලියන 114.6 ක රේගු බදු අහිමි වීම. ඒ යටතේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් 30% ක බද්දක් අය කරනු ලබන රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ Mazda RX 8 මාදිලියේ වාහන 33ක් ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇත. එනමුත් එම වාහනවල එන්ජිමේ වෙනස්කම් මත 15%ක බදු අය කළ යුතු රේගු සංයෝජිත වර්ගීකරණ අංක යටතේ රේගුව විසින් වාහන නිදහස් කර ඇත. එම බලපත්‍ර ලබා ගත් Mazda RX 8 වාහනයක් සඳහා රු.ලක්ෂ 35ක් බදු ගෙවිය යුතු වේ. මෙලෙස එන්ජිමේ වර්ගය ප්‍රකාශයට පත් කළ වාහන නොව වෙනත් එන්ජිමක් සහිත වාහන ආනයනය කිරීම හේතුවෙන් රේගුව මගින් එක් වාහනයක් සඳහා රු. ලක්ෂ 35ක් වෙනුවට රු. ලක්ෂ 1.5ක් පමණක් අය කර තිබීම.	රේගු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී ASYCUDA මෙහෙයුම් පද්ධතිය හරහා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සියළුම බලපත්‍රවලට අදාළව හාණ්ඩ නිදහස් කිරීමේ අනුමැතිය මෙම දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ලබන බැවින් සියළුම ආනයන බලපත්‍රයන්ට අදාළව ආනයනයක් සිදු වූ විට අදාළ හර කිරීම අනිවාර්යෙන්ම සිදු කර ගත යුතුය. ඒ හරහා නිකුත් කරන ලද සියළු බලපත්‍ර හර කිරීමේ කටයුතුවලට යොමු වන බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව බලපත්‍රයක් මත ගෙන්වා ඇති වාහනය, එම වාහනය ද යන්න පරීක්ෂාවට ලක් කළ හැකිය. ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ අංක IECD/02/07/2021 හා 2022.06.10 දිනැති ලිපිය මගින් අදාල විමර්ශණයේ වර්තමාන ප්‍රගතිය විමසන ලද අතර අංක IECD/02/07/2021 හා 2022.08.15 දිනැති සිහිකැඳවීම් ලිපිය මගින් අදාල විමර්ශනය කඩිනම් කර අවසන් කර දෙන මෙන් අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වැඩිදුරටත් දන්වා ඇත.

<u>නිර්දේශ</u> - ශ්‍රී ලංකා රේගුව තමන් ඉදිරියේ දිස්වන වාහනයට බදු අය කිරීම සිදු කරන බව නිරීක්ෂණය කළ කාරක සභාව, ආනයන බලපත්‍රය අනුව නියමිත වාහනය ගෙන්වා නිබෙදැයි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂාවට ලක් කිරීම. - මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ල ඉදිරිපත් කර වසරකට වඩා වැඩි කාලයක් ගත වී ඇති බැවින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් විමසීමක් කළ බව දන්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධයෙන් පැවැත්වෙන විමර්ශනයේ ප්‍රගතිය විමසීම හා එම පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම ප්‍ර.ග.නි. / ග.නි. විසින් කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම.	
<u>වලංගු කාලය ඉක්මවූ ඖෂධ ආනයනය කිරීම</u> ඖෂධ ආනයනය සඳහා ලබා දී තිබූ ලියාපදිංචි සහතිකයේ වලංගු කාලය ද ඉක්මවූ ඖෂධ ආනයනය කිරීම. <u>ආයු කාලය 75%ට අඩු ඖෂධ ගාස්තුවක් අය කර නිදහස් කිරීම</u> ඖෂධ ආනයනය කිරීමේ දී 75%ක ආයු කාලයක් ඉදිරියට තිබිය යුතු වුව ද ආයු කාලය 75%ට අඩු ඖෂධ සඳහා ගාස්තුවක් අය කර නිදහස් කිරීම. <u>නිර්දේශ</u> - 2018-2021 දක්වා කාලය තුළ 75%ට අඩුවෙන් ආයු කාලය සහිත ඖෂධ ආනයනය කර ඇති ප්‍රමාණ දත්ත සහිත වාර්තාවක් (ප්‍රමාණාත්මකව සහ ප්‍රතිශතාත්මකව) මාසයක් තුළ ප්‍ර.ග.නි./ ග.නි. විසන් කාරක සභාවට ඉදිරිපත් කිරීම.	2021 වර්ෂයට අදාළව ඉතිරි ජීව කාලය 75% කට අඩුවෙන් ආනයනය කරන ලද ඖෂධවල විස්තර සහිත වාර්තාව අංක MFO6/4/COPA/Export.Dept හා 2022.09.05 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. 2020 වර්ෂයට අදාළ වාර්තාව ද මේ වන විට සකස් කර ඇති අතර එය කාරක සභාවට යොමු කිරීමට කටයුතු කරමින් පවතී. 2018,2019 වර්ෂවලට අදාළ වාර්තා සකස් කරමින් පවතින අතර එම වාර්තා සකස් කිරීමේ දී දෛනික රාජකාරී බහුලත්වය හා පැරණි ලිපිගොනු සොයා ගැනීමේ අපහසුව යන දුෂ්කරතා පවතින බැවින් එම වාර්තා ද කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
<u>ඝන අපද්‍රව්‍ය අඩංගු බහාළුම්, බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කිරීම</u> 1969 අංක 01 දරන ආනයන හා අපනයන පනතේ 04 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ	අංක TIP/TP/21/03-Vol.II හා 2023.02.07 දිනැති ලිපිය මගින් වාණිජ කේන්ද්‍රස්ථාන රෙගුලාසි (Hub Operations Regulations) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන උපදෙස් පිළිබඳව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ආයෝජන

කියවිය යුතු එම පනතේ 26 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගයන් සම්බන්ධව 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන පත්‍රය මඟින් සඳහන් කර ඇති භාණ්ඩ ආනයනය කිරීමේදී ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍රයක් ලබාගත යුතුය. එහෙත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගමක් විසින් 2017 හා 2019 වර්ෂවල ආනයනය කර තිබූ මී.ර.ගෑ. වටිනාකම රු.19,760,224 වූ සන අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 2,131,325 ක් අඩංගු බහාලුම් 102 ක් සඳහා එලෙස බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කටයුතු කිරීම. එසේම, මෙසේ ආනයනය කොට ඇත්තේ ආරෝග්‍යශාලා අබලි ද්‍රව්‍ය (hospital waste) වන ඇඳන් හා මෙට්ට වැනි ද්‍රව්‍ය බව ද මෙහි දී අනාවරණය විය. <u>නිර්දේශ</u> ආනයන බලපත්‍ර ලබා ගත යුතු භාණ්ඩ නීති විරෝධී අන්දමින් මෙරටට ආනයනය කිරීම වැලැක්වීමේ නිසි වැඩපිළිවෙලක් සකස් කිරීම.	මණ්ඩලය දැනුවත් කර ඇත.
<u>බලපත්‍ර ලබා ගැනීමකින් තොරව පොහොර තොගයක් ආනයනය කර තිබීම හා අමතර ගාස්තුවක් අය කිරීමකින් තොරව එම පොහොර තොගය නිදහස් කිරීම</u> රජයේ හෝ පෞද්ගලික පොහොර සමාගම් පොහොර ආනයනය සඳහා බලපත්‍ර ලබා ගත යුතු බව ද, එසේ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ආනයනය කර තිබේ නම් ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් 5% ක අමතර ගාස්තුවක් අය කර එම ද්‍රව්‍ය සඳහා බලපත්‍ර නිකුත් කළ යුතු වේ. එසේ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව 2021 ඔක්තෝම්බර් මාසයේ දී රජය සතු පොහොර සමාගමක් විසින් පොහොර තොගයක් ආනයනය කර තිබීම, ආනයනය කළ පොහොර සඳහා රේගුව විසින් 5%ක අමතර ගාස්තුවක් අය කිරීමකින් තොරව එම පොහොර තොගය නිදහස් කිරීම හා එසේ බලපත්‍රයක් නොමැතිව පොහොර ආනයනය කිරීම නිසා අතිරේක ගාස්තුව වශයෙන් අය කළ යුතුව තිබූ රු.86,907,433 ක ආදායම රජයට අහිමි වීම. <u>නිර්දේශ</u>	කාරක සභාවේ නියෝග පරිදි සකස් කළ ලිපිය 2022.06.20 දින රජය සතු පොහොර සමාගම වෙත යොමු කිරීම සඳහා කටයුතු කරන ලදි.

- කෙසේ වුව ද, මෙවැනි සිදුවීම් ඉදිරියේ දී සිදු නොවිය යුතු බව අවධාරණය කළ කාරක සභාව, මෙම කරුණු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී විගණන විමසුමකට ලක් වූ කරුණක් බව අවධානයට ගෙන, මෙම සිදුවීම ඉදිරියට පූර්වාදර්ශයක් නොවිය යුතු බවත්, මෙවැනි ක්‍රියා ඉදිරියේ දී නැවත සිදු නොකරන ලෙසත් ප්‍ර.ග.නි./ ග.නි. විසින් පොහොර සමාගමට දන්වා යැවීම.	
<u>බලපත්‍ර මත අය කරන අතිරේක ගාස්තුව මත බදු පනත ප්‍රකාරව බදු අය නොකිරීම සහ බදු නිදහස් භාණ්ඩ ලෙස හඳුනා ගත් භාණ්ඩ සඳහා VAT අය නොකිරීම</u> ආනයන හා අපනයන පාලන පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන බලපත්‍ර මත සමාලෝචිත වර්ෂය සඳහා අය කරන අතිරේක ගාස්තුව වන රු.547,980,916ක් වෙනුවෙන් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව බදු අය නොකිරීමෙන් රු.43,838,47 ක් රජයට අහිමි වීම. Sri Lanka Customs national imports tariff guide පදනම් කර ගෙන ශ්‍රී ලංකා රේගුව මගින් බදු නිදහස් භාණ්ඩ ලෙස හඳුනා ගත් භාණ්ඩ සඳහා වන බලපත්‍ර ආදායම මත එකතු කළ අගය මත බදු (VAT) අය නොකිරීම නිසා ද රජයට ලැබිය යුතු ආදායම් අහිමි වීම. <u>නිර්දේශ</u> - ව්‍යවස්ථාපිත නීතිය යටතේ අය කරනු ලබන බලපත්‍ර ගාස්තු හා අතිරේක ගාස්තු එකතු කළ අගය මත බදුවලින් නිදහස් බවට සඳහන් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් ප්‍ර.ග.නි./ ග.නි. විසින් සති 2ක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම.	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ACT/17/9 හා 2021.12.30 දිනැති ලිපිය, අංක MFO6/4/COPA/Export.Dept හා 2022.09.05 දිනැති ලිපිය මගින් විගණකාධිපති වෙත ද පිටපතක් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කැඳවූ විශේෂ කාරක සභා රැස්වීම

2022 ජූනි 16

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය</u>	2015 වර්ෂයේ දී ආරම්භ වී පළමු අදියරෙන් පසු අතරමග නතර කර දැමූ මෘදුකාංග පද්ධතිය පිළිබඳ විස්තරාත්මක වාර්තාව අංක

2015 වර්ෂයේ දී ආරම්භ වී පළමු අදියරෙන් පසු අතරමග නතර කර දැමූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ මෘදුකාංග පද්ධතිය • ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2015 වසර වන විට ටෙන්ඩර් පටිපාටියක් ආරම්භ කර තිබූ නමුත් එම ක්‍රියාවලිය නවත්වා වෙනත් මෘදුකාංග පද්ධතියක් දියත් කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් ටෙන්ඩර් කැඳවා බාහිරව සේවය සපයන (outsource) ආයතනයක් වෙත ටෙන්ඩරය ලබාදීම. • මෙහි පළමු අදියර අවසන් කළ නමුත් පළමු අදියර ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ ගැටළු කිහිපයක් හේතුවෙන් දෙවන අදියර ආරම්භ කිරීමට නොහැකි වීම. • පළමු අදියරේ වැඩ කටයුතු අවසන් කිරීම සඳහා රු. මිලියන 8.1 ක් වැය වීම. • පළමු අදියරේ දී ආනයනකරුවන් 60ක් අතුරින් 12 දෙනෙකු පමණක් ලියාපදිංචි කර ඇති බැවින් එහි ප්‍රගතිය 20% ක් පමණක් වීම. <u>නිර්දේශ</u> - ව්‍යාපෘතියේ අරමුදල් මූලාශ්‍රය, අරමුදල් ප්‍රමාණය, අතරමග නැවැත්වීමට හේතු වූ කරුණු, පැවති දුර්වලතා, දෙපාර්තමේන්තුව විසින් මෙම තොරතුරු පද්ධතිය විධිමත්ව භාර ගෙන තිබේ ද යනාදී කරුණු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් මාසයක් තුළ ප්‍ර.ග.නි. / ග.නි. විසින් කාරක සභාව වෙත යොමු කිරීම.	MFO6/4/COPA/Export.Dept හා 2022.10.19 දිනැති ලිපිය මගින් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.
<u>එස්තෝනියානු ප්‍රදානය යටතේ ස්ථාපිත කිරීමට නියමිත තොරතුරු පද්ධතිය</u> • මේ සඳහා දේශීය වශයෙන් රු. මිලියන 15ක පමණ මුදලක් වැය වීම හා මෙම පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු වෙනත් පද්ධතීන් හා ගලපා ගැනීමේ ගැටළු (compatibility issues) ඇතිවීමේ හැකියාව <u>නිර්දේශ</u> - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත්	• ඇමරිකානු එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක EXBS වැඩසටහන මගින් ප්‍රදානයක් ලෙස ලැබීමට නියමිත තොරතුරු පද්ධතිය ලබා ගැනීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023.01.23 දින ලබා දී ඇත. 2023 අප්‍රේල් මාසයේ සිට එහි වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. • එස්තෝනියානු ප්‍රදානයක් වශයෙන් ලැබෙන තොරතුරු පද්ධතිය සම්පූර්ණයෙන්ම ප්‍රදානයක් වශයෙන් ලැබෙන අතර ඒ සඳහා දේශීය අරමුදල් වැය කිරීමට සැලසුම් කර නැත.

විධිමත් කිරීම සඳහා නව මෘදුකාංග පද්ධතිය කඩිනමින් ස්ථාපිත විය යුතු බව	

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

පාලක ජනරාල්
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

ඩී.ටී. උපුල්මණී ප්‍රේමතිලක
ආනයන හා අපනයන පාලක ජනරාල්
අනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකාව

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා රේගුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම
2022 ජුනි 15

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ආදායම් පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය. (RAMIS)</u> ශ්‍රී ලංකා රේගුව ,සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව,මහජන බැංකුව ,ලංකා බැංකුව හා ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම් පද්ධතිය හා අතුරු මුහුණත් කිරීමට පියවර ගෙන ඇති බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරියා ප්‍රකාශ කලේය. අන්තර් - ක්‍රියාකාරීත්ව රාමුවක් හා බදු ගෙවන්නන් හඳුනා ගැනීම සඳහා ඒකීය අංකයක් නොමැති වීම, සමහර ආයතන වල දත්ත පද්ධතියක් නොමැති වීම දත්ත පද්ධතීන් අතර නොගැලපීම් වැනි කරුණු හේතුවෙන් අනෙක් ආයතන පද්ධතිය සමඟ අතුරු මුහුණත් කිරීම (Inter face) ප්‍රමාද වී ඇති බවත්, දත්ත පද්ධතීන් පවත්වාගෙන යාම සඳහා සමාන තාක්ෂණයක් තිබිය යුතු බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. <u>නිර්දේශ</u> - වාර්ෂිකව රු.බිලියන 2000ක් උපයන හා රජයේ සමස්ථ ආදායමෙන් සියයට 90 ට වඩා දායක වන සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සමඟ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අතුරු මුහුණත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයේ නිලධාරීන් සහභාගී වන පසුදින (16.06.2022) පැවැත්වීමට නියමිත කාරක සභා රැස්වීමේදී මෙම ගැටළුව තවදුරටත් සාකච්ඡා කිරීම	ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ICT පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 182 හි පිටුවල අංකය 107 ට අදාළව පිළිතුර පහත පරිදි වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ශ්‍රී ලංකා රේගුව ඒකාබද්ධ කිරීම ශ්‍රී ලංකා රේගුවේ ආනයන හා අපනයන දත්ත IRD සමඟ බෙදා ගැනීම • SLC හි ASYCUDA පද්ධතිය IRD හි RAMIS සමඟ ඒකාබද්ධ කර ඇති අතර මෙම දත්ත ස්වයංක්‍රීයව RAMIS පද්ධතියට මාරු කරනු ලැබේ. ශ්‍රී ලංකා රේගුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පහත දත්ත ඉල්ලා ඇති අතර RAMIS පද්ධති සංවර්ධනය හේතුවෙන් එම කාර්යයන් තවමත් ඉතිරිව පවතී. • ශ්‍රී ලංකා රේගුවේ වෙළඳුන් ලියාපදිංචි කිරීමේ සත්‍යාපනය සඳහා වැට් බදු ලියාපදිංචි දත්ත • ආනයන ප්‍රකාශනවල ප්‍රතිසංවිධානය සඳහා VAT ණය වවුචර් දත්ත
<u>ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u> ආදායම් උත්පාදනය සඳහා බලපාන කරුණු • බදු ප්‍රතිපත්තිය වෙනස් වීම් • බදු නිදහස් කිරීම් හා බදු සහන • සීමාවන්/ නියාමන පියවර යෙදීම	ශ්‍රී ලංකාව මේ දක්වා පහත සඳහන් පරිදි ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික ගිවිසුම් 04 කට පමණ අත්සන් තබා ඇත. ISFTA- ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම PSFTA - පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම APTA - ආසියා පැසිපික් වෙළඳ ගිවිසුම

• සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු • ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණුන්දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් • කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ/ නියෝග • ද්වි පාර්ශ්වික හා බහු පාර්ශ්වික ගිවිසුම් • ඍතුමය බලපෑම් (උත්සව, ප්‍රවණතා යන ආදිය) • ගෝලීය ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් • හදිසි ආපදා • ආදායම් කාන්දුවීම් • ආදායම් කාන්දුවීම් වලට බලපාන්නේ අඩු තක්සේරු කිරීම්, භාණ්ඩ ප්‍රකාශයට පත් නොකිරීම, නීතිවිරෝධීව භාණ්ඩ ගෙන්වීම, හා සුසංයෝගී පද්ධති කේත වර්ගීකරණය • අඩු තක්සේරු කිරීම් වැලැක්වීම සඳහා භාණ්ඩ ආනයනයේදී කොළඹ හා මොරටුව විශ්ව විද්‍යාලවල සහයෝගයෙන් රේගු සටහන්කර ඉදිරිපත්කරන අවස්ථාවේම නිවැරදි තක්සේරුව ලබා ගැනීමට මෘදුකාංගයක් සකස් කිරීමට අංශයක් ස්ථාපිත කිරීමට ඇත. • නීති විරෝධීව භාණ්ඩ ගෙන්වීම වැලැක්වීම සඳහා ස්කැනරයක් භාවිතා කරනු ලබයි • වැරදි සුසංයෝගී පද්ධති කේත වර්ගීකරණය වැලැක්වීම සඳහා වූ යෝජනාවලියක් වැඩිදුර පියවර ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කර ඇත. <u>නිර්දේශ</u> • ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍ර.ග.නි. විසින් අවශ්‍ය පියවර ගැනීම	SAPTA - සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම මෙම ගිවිසුම් මඟින් ශ්‍රී ලංකාවට ආනයනයේදී තීරුබදු සහන ලබාදුන්නද, අපනයනයන් අධික ලෙස වැඩිවන නිසා අපනයන ආදායම් වැඩි වන අතර විදේශ විනිමය රටතුල ගලා ඒම සිදුවේ. අප්‍රේල් මස හා දෙසැම්බර් මස යෙදී ඇති උත්සව හේතුවෙන් එම කාලවලදී ආනයනයන් සාපේක්ෂව ඉහල යන බව දැක්විය හැකිය. කොළඹ හා මොරටුව විශ්ව විද්‍යාල වල සහයෝගය ඇතුව රේගු සටහන්කර ඉදිරිපත් කරන අවස්ථාවේ දීම නිවැරදි තක්සේරුව ලබා ගැනීමට අදාළව මෘදුකාංගයක් සකස් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කීපයක් පැවති වුවද, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ද ලබා ගැනීමට නොහැකි විය. එහෙත් ශ්‍රී ලංකා රේගුව විසින් මෘදුකාංගයක් සකස් කරමින් පවතින අතර එහි prototype එක ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු, සන්නිවේදන හා තාක්ෂණ අංශයේ දත්ත ගබඩාවේ (Server) පරීක්ෂා කිරීමට නියමිතය. රේගුව විසින් මූලික වශයෙන් දක්වා ඇත්තේ ආදායම් උත්පාදනයට බලපාන කරුණු හා සාධක කිහිපයක් වන අතර, එම සාධක වල විචල්‍යතාවය ආදායම් උස් පහත් වීමට බලපානු ඇත. භාණ්ඩ මිල තීරණය කිරීම පිළිබඳ වඩා ප්‍රශස්ථ ක්‍රමවේදයක් පවත්වා ගැනීම උදෙසා ජාතික ආනයනය මිල තක්සේරු දත්ත ගබඩා අංශය නමින් සුවිශේෂී අංශයක් රේගුවේ පිහිටුවීමට කටයුතු කර ඇත. එසේම Rapi-Scan ලෙස හඳුන්වන පරිලෝකන යන්ත්‍රයක් මේවනවිට කොළඹ වරාය පරිශ්‍රය තුල රේගු භාරයේ සවිකර ඇති අතර, අවධානම් කළමනාකරණ අංශය විසින් ස්වයංක්‍රීය ක්‍රමවේදයක් ඔසසේ තේරීමට පත්කරනු ලබන බහාලුම් සියල්ල මෙමඟින් පරිලෝකනයට (Scan) භාජනය කෙරේ. ආනයනකරුවන් විසින් භාණ්ඩ වර්ගීකරණය අවභාවිතා කිරීම වැලැක්වීමේ අරමුණින් භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ දැනුම පුළුල් කිරීම සඳහා විශේෂ පුහුණු වැඩමුළු රේගු නිලධාරීන්ට ලබාදීමට කටයුතු කර ඇත. ඊට අමතරව භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සඳහා භාණ්ඩ වර්ගීකරණ අංශයක් මෙන්ම එකී අංශයට ඉහලින් ක්‍රියාත්මක වන නාමකරණ සහ වර්ගීකරණ කමිටුවක් රේගුව තුල ක්‍රියාත්මක වේ.
<u>ආදායම් එකතු කිරීම වැඩි කර ගැනීම හා ප්‍රේෂණ ගලා ඒම වැඩි කිරීම සඳහා වූ යෝජනා</u> • එක හා සමාන භාණ්ඩ සඳහා සමාන තීරුබදු අනුපාතයන් හඳුන්වා දීම මඟින් බදු පැහැර හැරීම් අවම කිරීම උදා:- ඉරිහු පිටි හා ඉරිහු	රේගු බදු අය කිරීම, භාණ්ඩ වර්ගීකරණ කේතයන් (HS Code)හා ඊට අනුරූප බදු ප්‍රතිශතයන්ට අනුකූලව සිදු කරනු ලැබේ. ආසන්න වශයෙන් භෞතිකව සමානකම් පෙන්වන භාණ්ඩ වලට අසමාන හා විවිධ බදු ප්‍රතිශතයන් තිබුණත් සමහර අවස්ථා වල ඒවා

පිටි • රටවල් අතර සිදුවන වාණිජ වෙළඳාම සඳහා බදු පැනවීම • නිසි දේශීය උප බෙදීම් (National Sub division) නොමැති වීම නිසා නිවැරදි ව වර්ගීකරණය කළ නොහැකි භාණ්ඩ සඳහා නව දේශීය උප බෙදීම් හඳුන්වා දීම • විශේෂිතව හඳුනාගත් භාණ්ඩ සඳහා බදු හඳුන්වා දීම / බදු වැඩි කිරීම උදා:- පරිච්ඡේද 50 – 55, 58 හා 60 යටතේ රෙදිපිළි සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) අය කිරීම සලකා බැලීම. පවතින තීරුබදු ව්‍යුහය, බර අනුව අදාළ වන සෙස් (Cess) බද්දකින් සමන්විත වන බැවින් මෙම භාණ්ඩ සාමාන්‍යයෙන් වැඩි අගයක් ගනු ලැබේ. • ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක් වී අපනයන ප්‍රේෂණ ගලා ඒම අධීක්ෂණය කිරීම සඳහා ප්‍රේෂණ කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම • මිනිස් මැදිහත්වීම අවම කිරීම සඳහා අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන අතර ඒකාබද්ධ ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම • වෙළඳ කටයුතුවල පහසුව සඳහා රතු, කහ, කොළ හා සම්පූර්ණ තීරුබදු නිදහස් ආකාරයට ආනයනික භාණ්ඩ සඳහා අවදානම් කළමනාකරණ නිර්ණායකයක් හඳුන්වා දීම මඟින් පශ්චාත් නිශ්කාෂන විගණන ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම • නීති විරෝධීව භාණ්ඩ මෙරටට ගෙන්වීම වැලැක්වීම සඳහා රේගු නාවික අංශය ශක්තිමත් කිරීම	තාක්ෂණික වශයෙන් වෙන් කර හඳුනා ගැනීමට අපහසු වන අතර එකී තාක්ෂණික අපහසුතාවය මත සමහර ආනයනකරුවන් අඩු බදු ප්‍රතිශතයන් සහිත වර්ගීකරණ කේතය යටතේ වැරදි අයුරින් අදාළ භාණ්ඩය වර්ගීකරණය කරමින් ගෙවිය යුතු නියමිත බදු මුදල් නොගෙවා සාපේක්ෂව අඩු බදු මුදලක් ගෙවීමට ක්‍රියා කරන බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව, එසේ සිදු විය හැකි අක්‍රමිකතා වැළැක්වීමේ පියවරක් ලෙස ආසන්න භෞතික වශයෙන් සමානකම් පෙන්වන වෙනත් වර්ගීකරණ කේතයන් යටතේ වර්ගීකරණය වන භාණ්ඩ වලට අදාළ තීරු බදු ප්‍රමාණය සම කිරීම සුදුසු බව පෙනී ගොස් ඇත. ශ්‍රී ලංකා රේගුව විසින් දේශීය උප බෙදීම් (NSD) නිර්මාණය කිරීම සිදුවන්නේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (TIP) විසින් ශ්‍රී ලංකා රේගුවෙන් ඒ සඳහා ඉල්ලීමක් සිදු කළ විට පමණි. යම් දේශීය උප බෙදීමක් නිර්මාණය කිරීමට අවශ්‍ය බව ශ්‍රී ලංකා රේගුවට වැටහුණු විට, පළමුව එය TIP වෙත දන්වා ඔවුන්ගේ අනුමැතිය ලබා ගැනීම සිදුවේ. දැනට NSD නිර්මාණය කිරීම ආශ්‍රිතව ගැටලුවක් ලෙස පවතින්නේ NSD සඳහා වූ "Supplementary Explanatory Notes" නොමැති වීමයි. නමුත් වර්තමානයේ, ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද විශේෂිත කමිටුවක් හරහා එම කටයුත්ත සිදු වෙමින් පවතියි. අභ්‍යන්තර ප්‍රේෂණයන් අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව මඟින් පද්ධතියක් සකස් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව මඟින් අපේක්ෂිත ප්‍රේෂණ දත්ත සමඟ අපනයන ප්‍රකාශන දත්ත මහ බැංකුව වෙත යවනු ලබයි. අනතුරුව, සියළුම වාණිජ බැංකු මඟින් අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා අභ්‍යන්තර ප්‍රේෂණ දත්ත මහ බැංකු පද්ධතිය වෙත ලබාදිය යුතුයි. මිනිස් මැදිහත්වීම අවම කිරීම සඳහා අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන අතර ඒකාබද්ධ ස්වයංක්‍රීය පද්ධතියක් දැනට ක්‍රියාත්මකව පවතී. ඒ අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය වෙත ආනයන හා අපනයන රේගු සටහන්කර වල දත්ත ස්වයංක්‍රියව යැවීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත රේගුවෙන් නිදහස් කරන මෝටර් රථ වාහන වල රේගු සටහන්කර දත්ත ස්වයංක්‍රියව යැවීම සිදු කරනු ලබයි. එමෙන්ම, රේගුවෙන් භාණ්ඩ නිදහස් කිරීම සඳහා අනුමැතිය අවශ්‍ය අනෙකුත් රාජ්‍ය ආයතනවල අනුමැතිය Asycuda පද්ධතිය හරහා මාර්ග ගත ක්‍රමයට ලබාගැනීම ද සිදුකරනු ලබයි. මේ සඳහා

	දැනට එවන් රාජ්‍ය ආයතන 15 ක් Asycuda පද්ධතිය හරහා සම්බන්ධ වී ඇත. රේගු සටහන්කර සඳහා බදු හා අනෙකුත් මුදල් මාර්ගගත ක්‍රමයට ගෙවීම සඳහා ලංකා බැංකුව හා LankaPay හරහා පහසුකම් සලසා ඇත. තවද, ආනයන සඳහා ලංකාවෙන් පිටට යවන මුදල් ප්‍රේෂණයන් වාණිජ බැංකු වලට මාර්ගගත ක්‍රමයට Asycuda වෙත ලබා දීමට පහසුකම් සැලසීම සහ එසේ පැමිණෙන ප්‍රේෂණ සඳහා පමණක් ආනයන රේගු සටහන්කර යොමු කිරීමට ඉඩ සලසා ඇත. තවද, අපනයනය මගින් ලැබෙන ප්‍රේෂණයන් නිසි පරිදි ශ්‍රී ලංකාව තුලට ලැබෙන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා අපනයන රේගු සටහන් (CusDec) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම සිදු කරනු ලබයි. පශ්චාත් නිශ්කාෂණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේදී ඒ සඳහා අවධානය කළමනාකරණ අංශයේ මැදිහත් වීම හා මාර්ග උපදෙස් ඉතා වැදගත් වේ. මේ වන විට ලංකාවේ සිදුවන ආනයනයන් හට පහසුකම් සැලසීමේ මෙන්ම විගණනය සඳහා ඉලක්ක කිරීමේ අරමුණු ඇතිව ආනයනය කාණ්ඩ කිහිපයක් යටතේ හඳුනාගැනේ. මෙම හඳුනාගැනීම ස්වයංක්‍රීය පරිගණක ක්‍රමවේදයක් ඔස්සේ මානව මැදිහත්වීමකින් තොරව සිදුකරනු ලබයි. එහිදී අඩුම අවදානම් සහිත හෝ අවදානමට ගත නොහැකි සේ සැළකෙන ආනයනයන් සඳහා කොළ වර්ණය යටතේ (Green Channel) පහසුකම් ලබාදේ. මෙම හාණ්ඩ පරීක්ෂාවකින් තොරව මුදා හැරේ. මධ්‍යම ප්‍රමාණයේ අවදානම් සහිත ආනයනයන් කහ වර්ණය යටතේ හඳුනාගනු ලබන අතර ඒවා කිසියම් ප්‍රතිශතයක් දක්වා මුදාහැරීමට පෙර පරීක්ෂාවට ලක්කරනු ලබයි. අවදානම් වැඩි (High Risk Cargo) ලෙස පරිගණක පද්ධතිය මගින් හඳුනාගන්නා ආනයනයන් රේගු පරීක්ෂණ අංගවලදී පූර්ණ පරීක්ෂාවට ලක්කෙරේ. මෙම ක්‍රමවේදය පශ්චාත් විගණනය සඳහා ආනයනයන් හෝ ආනයනික සමාගම් තෝරා ගැනීමේදී එය සාර්ථක පරීක්ෂාවක් ඉටු කිරීමට උපකාරී වන ක්‍රමවේදයක් ලෙස පවතී. ඒ අනුව, අවදානමේ ස්වභාවය මත පශ්චාත් විගණන නිශ්කාෂණය සඳහා ඉලක්ක කිරීම තුලින් අඩු කාර්යමණ්ඩලයක් සහ කාර්යක්ෂම ශ්‍රමභාවිතය ඔස්සේ වඩා නිවැරදි හා සාර්ථක විගණනයක් සිදුකිරීමට පශ්චාත් විගණන අංශයට හැකිවී ඇත. දැනට රේගු සමුද්‍ර අංශය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය බෝට්ටු සහ අනෙකුත් සන්නිවේදන හා වෙනත් අදාල උපාංග සපයා ගැනීමේ

	අපහසුතාවක් (වර්තමාන ආර්ථික තත්වය මත) පවතින අතර, මේ සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ මූලිකත්වයෙන් මෑතකදී පැවති ඕස්ට්‍රේලියානු සමුද්‍රීය සීමා පාලන අධිකාරියේ නිලධාරියකු (AUSTRALIAN Boarder Control Force) සමග පැවති සමුළුවේදී රේගු සමුද්‍ර අංශ ගොඩ නැගීම සඳහා අවශ්‍ය උපාංග හා නිලධාරි පුහුණුව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කල අතර, මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබේ යැයි හැගේ.
<u>සංයෝජිත වර්ගීකරණ (HS Code) වෙනස් කිරීම</u> මෙවැනි අක්‍රමිකතා වැලැක්වීමට දෙපාර්තමේන්තුව විසින් දැනටමත් නිසි ක්‍රියාමාර්ග ගෙන ඇති බව ග.නි. පැවසීය.	<u>අංක (13) - සංයෝජික වර්ගීකරණ අංක (HS CODE) වෙනස් කිරීම.</u> මෙවැනි අක්‍රමිකතා වැළැක්වීමට දෙපාර්තමේන්තුව විසින් දැනටමත් නිසි ක්‍රියාමාර්ග ගෙන ඇත. ඒවා නම්, √ සියළුම ආනයනකරුවන් විසින් සිය ආනයන සටහන්කර සියල්ලම අනිවාර්යයෙන්ම මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළයුතු ලෙස නියෝග කර ඇත. √ එම ආනයන සටහන්කරයට අදාළ වන සියළුම ආනයන ලියකියවිලි සහ වාර්තා සියල්ලම එකී සටහන්කරයට උඩුගත (Upload) කළයුතු බව නියෝග කොට ඇත. √ එසේ නොවන කිසිදු ආනයන සටහන්කරයක් ක්‍රියාත්මක (Process) නොකරන ලෙස අදාල සියළුම නිළධාරීන්ට උපදෙස් දී ඇත. √ භාණ්ඩ පරීක්ෂණ අංගනය තීරණය වීම, ගේට්ටු අවසරපත් මුද්‍රණය, භාණ්ඩ පරීක්ෂණ නියෝග සහ භාණ්ඩ නිදහස් කිරීමේ සියළුම නියෝග පරිගණක මගින් තීරණය වන ලෙස Asycuda දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඇත. √ ආනයනකරු ඉදිරිපත් කර ඇති වර්ගීකරණ සංකේත අංකය (HS Code) අදාළ සටහන්කරය සමග උඩුගතකොට ඇති (Upload) ලියකියවිලි වලින් තීරණය කළ නොහැකි නම් වැඩිපුර වාර්තා උඩුගත කරන ලෙස ආනයනකරුගෙන් ඉල්ලා සිටීමටත් එම ලියවිලි උඩුගත කිරීමෙන් පසුවද අදාළ වර්ගීකරණ අංකය පිළිබඳ යම්කිසි සැකයක් ලියවිලි පරීක්ෂා කරන රේගු නිළධාරියෙකුට ඇත්නම් තමාගේ සැකයට හේතුවන කරුණු සියල්ලම අදාල සටහන්කරයට උඩුගත කොට භාණ්ඩ පරීක්ෂණ අංගන වල නිළධාරීන්ට එම ලේඛණ ආනයනික භාණ්ඩ සමග සසඳා බලා තීරණය කරන ලෙස ඉල්ලීමක් අදාළ ආනයන සටහන්කරයට උඩුගත

	කරන ලෙස උපදෙස් දී ඇත. √ භාණ්ඩ පරීක්ෂණ අංගනවල නිළධාරීන් ඉදිරිපත්ව ඇති ලියවිලි ආනයන භාණ්ඩ සමග සසඳා බලා සටහන්කරයේ ඇති වර්ගීකරණ අංක සමග නොගැලපේ නම් ආනයනකරුට ඒ බව දැනුම්දීමටත් ආනයනකරු එම තීරණය පිළිනොගන්නේ නම් අදාළ සියළුම ආනයන ලියවිලි ආනයනික භාණ්ඩවල නියැදි (Sample) සමග භාණ්ඩ වර්ගීකරණ අංශය වෙත යොමුකරන ලෙස උපදෙස් දී ඇත. √ ප්‍රකාශන අංශයේ නිළධාරීන් සඳහා නිරන්තරයෙන් භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ දේශන සහ වැඩමුළු පැවැත්වීම මගින් දැනුම වර්ධනය කරගැනීමට අවස්ථාව සලසා ඇත. √ භාණ්ඩ වර්ගීකරණ අංශයේ (Commodity Classification) නිළධාරීන් ලෝක රේගු සංවිධානය මගින් ක්‍රියාත්මක කරනු ලබන භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ සමුළු වලට සහභාගි කරවීම මගින් එම නිළධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරගැනීමට අවස්ථාව සලසා දී ඇත.
<u>2017 වසරේ සිට 2021 වසර දක්වා ඛනිජ තෙල් නිෂ්පාදන බදු වලින් ලැබූ ආදායම 72% කින් අඩුවීම</u> ඉන්ධන මිල වැඩිවීම සඳහා හඳුන්වා දුන් බදු නිදහස් කිරීම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදන බද්ද අඩු වූ බව ප්‍ර.ග.නි. /ග.නි. ප්‍රකාශ කළේය.	2022 වසරේ සිට ඉන්ධන බදු ප්‍රතිශතය විශාල ලෙස වැඩි විය. ආනයනය කරන ඉන්ධන ප්‍රමාණයෙහි අඩුවීමක් තිබුණද අයකරනු ලබන බදු ප්‍රමාණයෙහි වැඩිවීමක් පෙන්නුම් කරයි. වර්තමානයේ පෙට්‍රල් සඳහා රු. 77/- ක් දක්වා වූ නිෂ්පාදන බද්දක් සහ ඩීසල් සඳහා රු. 63/- ක් දක්වා වූ නිෂ්පාදන බද්දක් පනවා ඇත. තවද, රේගු බදු හා වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද (PAL) ක් ද පනවා ඇත. 2021 වර්ෂයට සාපේක්ෂව විශාල ලෙස බදු ප්‍රතිශතයන්හි වැඩිවීමක් පෙන්නුම් කලද, ආනයන ප්‍රමාණයෙන් අඩුවීම හේතුවෙන් ආදායම් විශාල වැඩිවීමක් පෙන්නුම් නොකරයි. 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ 5% ආදායම් වැඩිවීමක් ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා ශ්‍රී ලංකා රේගුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

පී.බී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම
2022 ජූනි 15

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
නිරීක්ෂණ, නිර්දේශ/නියෝග අංක 12 – "ආදායම් එකතු කිරීම, වැඩිකර ගැනීම හා ප්‍රේෂණ ගලා ඒම වැඩි කිරීම සඳහා වූ යෝජනා"	මේ සම්බන්ධයෙන් වූ කරුණු රජයේ ගිණුම් කාරක සභාවට 2022 ජූනි 15 වන දින ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේදී ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නියෝජනයක් සිදු නොවූ අතර, මෙම යෝජනාවන් ද මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කරන ලද යෝජනාවන් නොවේ. එහෙත්, එම කරුණු අතරින් පහත සඳහන් වූ අයිතමයන් හතර (4) සඳහා පමණක් මෙම දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ පහත පරිදි වේ. i. එක හා සමාන භාණ්ඩ සඳහා සමාන තීරුබදු අනුපාතයන් හඳුන්වාදීම මඟින් බදු පැහැර හැරීම් අවම කිරීම. උදා - ඉරිහු පිෂ්ඨය හා ඉරිහු පිටි තීරු බදු අනුපාත ක්‍රියාත්මක වනුයේ ඒ ඒ භාණ්ඩ වර්ගීකරණය කරන රේගු සංකේත අංක පදනම් කරගෙනය. එම වර්ගීකරණය සකස් කර ඇත්තේ ඒ ඒ භාණ්ඩවල පවත්නා එකතු කළ අගය පදනම් කරගෙන/ස්වරූපය පදනම් කරගෙන වන අතර ඒ අනුව, අමු ද්‍රව්‍ය, අතරමැදි තත්ත්වයෙන් සහ නිමි නිෂ්පාදිත තත්ත්වයෙන් භාණ්ඩයක් වර්ගීකරණය කරන අවස්ථාවන් වෙන් කරගෙන එකී රේගු සංකේතාංක සකස් කර ඇති බැවින්, එක සමාන භාණ්ඩ හඳුනා ගැනීමක් කළ නොහැකි බැවින් සමාන තීරු බදු අනුපාතයන් ක්‍රියාත්මක කිරීම සිදු කළ නොහැක. එහෙත්, ආනයනය කරන අවස්ථාවේදී එක ම ස්වරූපයක් ගැනීම හේතුවෙන් වෙන් කර හඳුනා ගැනීමට අපහසු විය හැකි භාණ්ඩ සඳහා සමාන තීරු බදු අනුපාතයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ii. රටවල් අතර සිදුවන වාණිජ වෙළඳාම සඳහා බදු පැනවීම.

	"රටවල් අතර සිදුවන වාණිජ වෙළඳාම සඳහා බදු පැනවීම" යන්න ඉංග්‍රීසි පරිවර්තනයෙහි සඳහන් කර ඇත්තේ "Taxation of Cross-Border E-Commerce" ලෙස බැවින් එය කරුණු දෙකක් ලෙස නිරීක්ෂණය කළ අතර අදාල කරුණු දෙක සඳහා නිරීක්ෂණ පහත පරිදි ඉදිරිපත් කරමි. • රටවල් අතර සිදුවන වාණිජ වෙළඳාම සඳහා බදු පැනවීම රටවල් අතර වෙළඳාම් සිදු කිරීමේදී, අමු ද්‍රව්‍ය, අතරමැදි තත්ත්වයන් සහ නිමි නිෂ්පාදන තත්ත්වයන් මත පරිභෝජන හෝ ප්‍රාග්ධන භාණ්ඩ වශයෙන්, භාණ්ඩයක් භාවිතයට ගන්නා ස්වරූපය මත වර්ගීකරණය කරමින්, රටේ අවශ්‍යතාවය මත ආනයන බදු ව්‍යුහය ක්‍රියාත්මක කිරීම සිදු කරයි. උදාහරණයක් ලෙස දේශීය භාණ්ඩ නිෂ්පාදින කර්මාන්තයන් ආරක්ෂා කිරීම සඳහා ඊට සමාන භාණ්ඩ ආනයනය කිරීමේදී, එකී අයිතම සඳහා ඉහළ බදු අනුපාතිකයක් පැනවීම සිදු කරනු ලබන අතර, අමු ද්‍රව්‍ය හා නොනිමි භාණ්ඩ ආනයනය කිරීමේදී එකී අමු ද්‍රව්‍ය හා නොනිමි භාණ්ඩ සඳහා බදු සහනයන් සලසන අවස්ථාවන් ඇත. එමෙන්ම, අවස්ථානුකූලව අදාළ පාර්ශවකරුවන් හා රාජ්‍ය ආයතනවල ඉල්ලීම මත, බදු අනුපාතයන් සංශෝධනයට ලක් කරනු ලැබේ. එසේම, රටවල් අතර සිදුවන වාණිජ වෙළඳාම මත බදු පැනවීම ආදායම් එකතු කිරීමේ අරමුණින්ම පමණක් සිදු කරනු ලබන කර්තව්‍යයක් නොවන අතර, ශ්‍රී ලංකාවේ අනෙකුත් අවශ්‍යතා හේතුවෙන්ද බදු පැනවීම සිදු කරනු ලැබේ. • Taxation of Cross-Border E-Commerce (දේශසීමා ආශ්‍රිත ඊ-වාණිජ්‍යය කටයුතු සම්බන්ධිත බදුකරණය) ඊ - වාණිජ්‍යය වෙළඳ කටයුතු ශ්‍රී ලංකාව තුළ නැඟී එන (Emerging Trade Transaction) ප්‍රවලිත ජාත්‍යන්තර සංකල්පයකි. මෙම තත්ත්වය 2019 වර්ෂයට පෙර හඳුනාගත් අතර, ඒ අනුව එකී වෙළඳ කටයුතු සඳහා බදුකරණයක් සිදු කිරීමට සලකා

	බලන ලදී. එහෙත්, එම අවස්ථාවේදී, මෙරට තුළ ඇතිවෙමින් පැවති තාක්ෂණිකමය සංවර්ධනය (IT Development) සහ රැකියා අවස්ථාවන් උත්පාදනය වැනි කරුණු සැලකිල්ලට ගෙන, දියුණු වෙමින් පැවති ඊ - වාණිජ්‍යය වෙළඳ කටයුතු මත බදු පැනවීම ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාත්මකභාවයට පත් නොකරන ලදී. එසේම මේ වන විට Alibaba, Uber, eBay, Amazon, Daraz වැනි ඊ - වාණිජ්‍යය මෙහෙයුම්කරුවන් සඳහා මෙන්ම, ඊ- වාණිජ්‍යය කටයුතුවල යෙදෙන අනෙකුත් සියලුම අදාළ පාර්ශවකරුවන් වෙනුවෙන් ද, නුදුරු අනාගතයේදී බදුකරණය හඳුන්වාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් සැලකිල්ලට භාජනය කරනු ලබයි. iii. නිසි දේශීය උප බෙදීම් (National Sub Divisions - NSD) නොමැති වීම නිසා නිවැරදිව වර්ගීකරණය කළ නොහැකි භාණ්ඩ සඳහා නව දේශීය උප බෙදීම් හඳුන්වා දීම. දේශීය කර්මාන්ත සහ රාජ්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව නව රේගු සංකේතාංක ඇති කිරීමට රේගු දෙපාර්තමේන්තුවේ ද එකඟතාවය මත කටයුතු කරන අතර 2022 වර්ෂයේදී නව රේගු සංකේතාංක 56ක් ඇති කිරීමටත්, 2023 වර්ෂය සඳහා වන රේගු සංකේතාංක 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ, 2023.01.01 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2312/75 මඟින් ආදායම් සංරක්ෂණ ආඥා අංක 7/2022 ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ මඟින් නව රේගු සංකේතාංක (NSD) 12ක් ඇති කිරීමද, රේගු සංකේතාංක 14ක පමණ විස්තර සංශෝධනයක් (Description Changes) ද සිදු කර ඇත. iv. විශේෂිතව හඳුනාගත් භාණ්ඩ සඳහා බදු හඳුන්වා දීම/බදු වැඩි කිරීම. වර්තමාන විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමේ අරමුණින් මහ බැංකුවේ ද නිර්දේශ පරිදි තෝරාගත් ආනයනික භාණ්ඩ සඳහා බදු වැඩි කිරීමට 2022.05.31 දිනෙන් කටයුතු කරන ලද අතර, මේ සඳහා තීරු බදු වැඩි කිරීමටත්, තෝරාගත් භාණ්ඩ

	සඳහා අධිභාරයක් පැනවීමටත් කටයුතු කර ඇත. එයට අමතරව 2022.11.14 දිනැති අයවැය යෝජනා පරිදි මිශ්‍ර බදු අනුපාත පැවති භාණ්ඩ සඳහා ඌන ගණනය කිරීම් (Under Valuation) වලක්වා, නිසි පරිදි තක්සේරු කරන ලද බදු ආදායම් උපයා ගැනීම සඳහා එකී මිශ්‍ර බදු අනුපාතවල ඒකක බද්ද (Unit rate) නව විනිමය අනුපාතයන්ට අනුව වැඩි කිරීමට පියවර ගෙන ඇත. මෙය, තීරු බදු සහ CESS බදු මඟින් ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ විවෘත ගිණුම් ක්‍රමය (Open Accounts) මඟින් භාණ්ඩ ආනයනය සීමා කිරීමට කටයුතු කර ඇති අතර, එමඟින් ඌන ගණනය කිරීම් සහ ඌන ඉන්වොයිස් කිරීම් වළක්වා ගත හැකි විය.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

කේ. ඒ. විමලේන්ද්‍රරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
2022 ජුනි 09

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>විදේශ ව්‍යාපෘති සඳහා වගකීමට බැඳීමේ ගාස්තු</u> • 2020 හා 2021 වර්ෂවල විදේශ ව්‍යාපෘති සඳහා වගකීමට බැඳීමේ ගාස්තු (commitment fee) ලෙස පිළිවෙළින් රු. බිලියන 4ක් හා රු. බිලියන 1.8ක් බැගින් ගෙවා ඇති බවත් නිසි ව්‍යාපෘති කළමනාකරණ ක්‍රියාදාමයක් මඟින් මෙම තත්ත්වය මග හරවා ගත හැකි බවත් කාරක සභාවේ අදහස විය <u>ව්‍යාපෘති නවතා දැමීම හේතුවෙන්ද රජයට විශාල පාඩුවක් සිදු වීම</u> • ඇතැම් ව්‍යාපෘති කිසිදු තර්කානුකූල පදනමකින් තොරව අතරමග නවතා දැමීම හේතුවෙන්ද රජයට විශාල පාඩුවක් සිදුවීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සිදු නොකරන බවත්, ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ යාන්ත්‍රණය මෙහෙයවීම පමණක් සිදු කරන බවත්, සඳහන් කළේය. එසේම අවුරුදු කිහිපයක් පුරා පවතින ව්‍යාපෘති සඳහා ක්‍රමිකව මුදල් ගෙවීම (disburse)සිදු කරන බවද, මෙම මුදල් වියදම් කිරීමට අදාළව මුදල් ප්‍රවාහ සටහනක් (cash flow)සකස් කරන බවද, වියදම් වූ මුදලට පොළිය (interest)ගෙවිය යුතු බවද, වියදම් නොකළ මුදල (undisbursed money)සඳහා එම වර්ෂයට අදාළ වගකීමට බැඳීමේ ගාස්තු (commitment fee)ගෙවිය යුතු බවද, ග.නි. පැහැදිලි කළේය. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය දක්වන දායක රාජ්‍යයන් විසින් ලබාදෙන දායකත්වය වෙනුවෙන් අදාළ කාල පරාසය පුරාවට වගකීමට බැඳීමේ ගාස්තු ගෙවීමට සිදුවන අතර, ව්‍යාපෘතිය නියමිත කාල රාමුවෙන් බැහැරව කඩිනම් කිරීම සිදු කළ නොහැකි බවද, මෙහිදී ආනාවරණය විය. කෙසේ වෙතත්, විවිධ හේතූන් මත සිදුවන ව්‍යාපෘති ප්‍රමාදයන් මහහරවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් අංක MOFPE&PD/ERD/2020/1 හා 2020.02.12 දින දරණ ""Ensuring Project Readiness for Effective Disbursement of Foreign/Loacal Financing and Strengthening the Project Management"" නමින් චක්‍රලේඛයක්නිකුත් කරන ලද බව ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුව රේඛීය	සමහර ණය ගිවිසුම් වලට අනුව ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය දක්වන දායක රාජ්‍යයන් විසින් ලබාදෙන දායකත්වය වෙනුවෙන් අදාළ කාල පරාසය පුරාවට වගකීමට බැඳීමේ ගාස්තු ගෙවීමට සිදුවන අතර, ව්‍යාපෘතිය නියමිත කාල රාමුවෙන් බැහැරව කඩිනම් කිරීම සිදු කළ නොහැකිය. කෙසේ වෙතත්, විවිධ හේතූන් මත සිදුවන ව්‍යාපෘති ප්‍රමාදයන් මහහරවා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් අංක MOFPE&PD/ERD/2020/1 හා 2020.02.12 දින දරණ ""Ensuring Project Readiness for Effective Disbursement of Foreign/Loacal Financing and Strengthening the Project Management"" නමින් චක්‍රලේඛයන් නිකුත් කොට ඇත.. ඒ අනුව රේඛීය අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර ව්‍යාපෘතිය ප්‍රමාද විය හැකි කරුණු පුරෝකථනය කර තිබිය යුතු අතර,එමඟින් ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් සිදුවන වගකීමට බැඳීමේ ගාස්තු එකතු වීම අවම කර ගත හැක.

අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර ව්‍යාපෘතිය ප්‍රමාද විය හැකි කරුණු පුරෝකථනය කර තිබිය යුතු බවද, එයින් ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් සිදුවන වගකීමට බැදීමේ ගාස්තු එකතු වීම අවම කර ගත හැකි බවද හෙතෙම ප්‍රකාශ කළේය.	
<u>අතරමඟ නවතා දැමුණු සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය</u> රු. බිලියන 5ක මුදලක් වියදම් කර අතරමඟ නවතා දැමුණු සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය හේතුවෙන් අමතර රු. බිලියන 5ක දඩ මුදලක් ද සමඟින් රු. බිලියන් 10ක පාඩුවක් රජයට දැරීමට සිදුවීම ඇ.ඩො.බිලියන 1.85ක ණය ආධාර හා ශ්‍රී ලංකා රජය දැරූ වියදම්ද සමඟ මුළු වටිනාකම ඇ.ඩො. බිලියන 2.2ක් වන, වසර 40ක කාලයක් සඳහා ජපන් රජයේ ණය සහනාධාර මත ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ මෙම සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින කාලය තුළ අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයක් පරිදි නතර කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය හරහා රේඛීය අමාත්‍යාංශයට උපදෙස් ලැබී තිබූ බව ප්‍ර.ග.නි/ග.නි සඳහන් කළේය. ඒ අනුව සිදු වූ දීර්ඝ අමාත්‍ය මණ්ඩලීය සාකච්ඡාවෙන්ගෙන් අනතුරුව ව්‍යාපෘතිය නතර කිරීමට තීරණය කළ අමාත්‍ය මණ්ඩලය, මෙම ණය ගිවිසුම අවසන් කිරීමේ කටයුතු ඇරඹීම සඳහා තම දෙපාර්තමේන්තුවට උපදෙස් දුන් බව ග.නි. අනාරවරණය කළේය සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය නවතා දැමීමේ කාරණයට තුඩුදුන් වාතාවරණය පිළිබඳ විස්තරයක් කළ ග.නි. වර්ෂ 2017/2018 වූ එම කාලය වන විට රටේ ණය බර දිගින් දිගටම උග්‍ර වන බව පැහැදිලි වූ හෙයින්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහ බැංකුව හා ලෝක බැංකුව හා එක්ව මධ්‍යම කාලීන ණය කළමනාකරණ උපායමාර්ගීක සැලසුමක් සකස් කල බව ප්‍රකාශ කළේය. ඒ අනුව , 2020.05.13 දින "Foreign Resource Mobilization 2020-2025" යන නමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නිකුත් කල බව සඳහන් කල ප්‍ර.ග.නි./ ග.නි. එහිදී වර්තමානයේ උද්ගතව ඇති ආර්ථික අර්බුදය පුරෝකථනය කල බව සඳහන් කළේය. මෙකී කරුණුද මත පදනම්ව, ඉහත ව්‍යාපෘතිය ඉදිරියට පවත්වා ගෙන යාම අපහසු බව අමාත්‍ය මණ්ඩලය තීරණය කරන්නට ඇති බව ග.නි. සඳහන් කළේය. කෙසේ වෙතත්, ඉහත ව්‍යාපෘති සඳහා ගිවිසුම්ගත වීමට පෙර මෙවැනි තත්ත්වයන් උද්ගත වන බව පුරෝකථනය කලේ නම් රජයට සිදුවූ විශාල පාඩුව සේම රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පළුදු වීමද වලකා ගත හැකිව තිබූ බව කාරක සභාව පෙන්වා දුන්නේය.	වර්ෂ 2017/2018 කාලය වන විට රටේ ණය බර දිගින් දිගටම උග්‍ර වන බව පැහැදිලි වූ හෙයින්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මහ බැංකුව හා ලෝක බැංකුව හා එක්ව මධ්‍යම කාලීන ණය කළමනාකරණ උපායමාර්ගීක සැලසුමක් සකස් කරන ලදි. ඒ අනුව , 2020.05.13 දින "Foreign Resource Mobilization 2020-2025" යන නමින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් නිකුත් කොට ඇත. එහිදී වර්තමානයේ උද්ගතව ඇති ආර්ථික අර්බුදය පුරෝකථනය කරන ලදි. මෙකී කරුණු ද මත පදනම්ව, ඉහත ව්‍යාපෘතිය ඉදිරියට පවත්වා ගෙන යාම අපහසු බව එවක පැවති අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදි. ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් ඉදිරියේදී පැමිණීමට නියමිත ආර්ථික අර්බුදය පුරෝකථනය කොට තිබූ නමුත්, . එහෙත් පැවති ආර්ථික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය රජයේ ප්‍රමුඛතාවයන් සහිත ව්‍යාපෘතියක් වූ බැවින්, එය ක්‍රියාත්මක කිරීමට රජය විසින් උපදෙස් ලබාදෙන ලදි එවකට පැවති තත්වය එසේ වුවද, මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නාගරික හා සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ 23/0389/618/013 - I හා 2023.02.20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ පිළිබඳ නිසි සැලකිල්ල දක්වමින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උපාය මාර්ගික තීරණ ගැනීමට හා කඩිනම් ප්‍රතිචාර දැක්වීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික මෙහෙයුම් මැදිරියට යොමුකර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් නම් කරන ලද විද්වත් මණ්ඩලය සමග ද සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ජාතික මෙහෙයුම් මැදිරිය විසින් සකස් කරන ලද වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත අංක 23/0953/604/098 හා 2023.05.22 දිනැති ව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, කොලඹ තදාසන්න ප්‍රදේශවල වාහන තදබදය අවම කිරීමට හා ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවීමට යෝජිත සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතිය වැදගත් ව්‍යාපෘතියක් බව නිරීක්ෂණය කරන ලද ජාතික මෙහෙයුම් මැදිරිය, පවතින මූල්‍ය හා ආර්ථික පසුබිම මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇතිකරගෙන ඇති එකඟතාවයක් පිළිබඳ සලකා බලා, රාජ්‍ය මූල්‍යයනයට අහිතකර බලපෑමක් නොවන ආකාරයෙන් හා ජපාන රජය සමග ඇති රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට බලපෑමක් ඇති නොවන

	ආකාරයෙන් ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා, ජාතික මෙහෙයුම් මැදිරිය විසින් ඉදිරිපත් කර තිබූ අංක I සිට V දක්වා යෝජනා සඳහා ක්‍රියාත්මක කිරීම සඳහා 2023.05.22 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී ඇත. (අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා තීරණය අමුණා ඇත.) ඒ අනුව, යෝජනා අංක I හා II සම්බන්ධයෙන් ජපාන රජය හා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා (JICA ආයතනය) සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
2022 ජූනි 09

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
ජාතික ඇගයුම් ප්‍රතිපත්තියක (National Evaluation Policy) ඇති වැදගත්කම විදෙස් ණය නිසි අයුරින් කළමනාකරණය කරගැනීමට මෙවන් ප්‍රතිපත්තියක ඇති වැදගත්කම පැහැදිලි කළ කාරක සභාව ජාතික ඇගයීමේ ප්‍රතිපත්තියක් සැකසීම පිළිබඳව සිය අවධානය යොමු කරන ලෙසට ප්‍ර.ග.නි. ට නියෝග කළේය.	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය (NEP) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති අතර, එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් 'EvalColombo 2018 හිදී දැනටමත් එළිදක්වා ඇත. අමාත්‍ය මණ්ඩල නියෝගයන්ට අනුව මෙම ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවේද සභාගත කර ඇත. ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් හා ඌන කාර්යක්ෂමතාවය රාජ්‍ය ආයෝජනවල ප්‍රශස්ථ ප්‍රතිඵල ජනනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි. එබැවින්, ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය උපායමාර්ග, මාර්ගෝපදේශ, ප්‍රමිතීන් හා ආචාරධර්ම ඇතුලත් කර පුළුල් උපදේශන ක්‍රියාවලියකින් පසුව ජාතික ඇගයීම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ රාමුව ද මේ වන විට සකස් කර ඇත. මේ යටතේ රජයේ පරිපාලන ව්‍යුහයේ සියලුම මට්ටම් තුළ සංවර්ධන වැඩසටහන් ඇගයීම ආයතනිකකරණය කිරීම සඳහා පුහුණු කිරීම් සහ උපදේශන මාලාවක් මෙම වසරේ අප්‍රේල් මස සිට පැවැත්වීමට ද සැලසුම් කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
2022 ජූනි 09

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ණය ගිවිසුම්වලට එළැඹ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති</u> අප රට ණය ගිවිසුම්වලට එළැඹ ක්‍රියාත්මක කරන්නේ ජාතික මෞතික සැලැස්මට අනුකූල, රටට අත්‍යාවශ්‍ය ව්‍යාපෘතිමද යන්න විමසා බැලීම මෙහිදී ග.නි. ප්‍රකාශ කළේ අප රටට වසර 10ක පමණ කාලයක් සඳහා නිශ්චිතව හඳුනාගත් සංවර්ධන සැලැස්මක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් බවයි. මේ අවස්ථාවේදී ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව වැනි ආයතන හා එක්ව එවන් වසර 10ක නිශ්චිත සංවර්ධන සැලැස්මක් සකසා, එය පාර්මේන්තුවේ සම්මත කර, එය ක්‍රියාවට නැගිය හැකි නම් අද අප මුහුණ දී ඇති අර්බුදයට විසඳුම් සැපයිය හැකි බව ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය. මෙහිදී අදහස් දැක්වූ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේ වසර 10ක සංවර්ධන සැලැස්මක් පමණක් නොව රජය වෙනස්වීමේදී දේශපාලන ප්‍රතිපත්තියක් මත වෙනස් නොවන සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් අප රටට අවශ්‍ය වන බවයි. <u>නිර්දේශ</u> - වසර 10ක් සඳහා නිශ්චිතව හඳුනාගත් ජාතික සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් ආරම්භ කර, සැලැසුම් සකස් කර හැකි ඉක්මනින් වාර්තා කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ග.නි. ට නියෝග කළේය.	වත්මන් ජනාධිපතිතුමන් අගමැතිතුමන් ව සිටි වකවානුව තුල දස වසරක සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම වෙනුවෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමන්ගෙන්, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ (IPS) විධායක අධ්‍යක්ෂතුමියගෙන් සහ ආර්ථික උපදේශක ඩැනියෙල් අල්පොන්සස් මහතාගෙන් සැදුම්ලත් ජාතික ප්‍රතිපත්ති උපදේශන කමිටුවක් (NPAC) 2022 ජූනි 20 දින පත්කරන ලදී. අදාල පාර්ශව අතර පැවති අඛණ්ඩ සාකච්ඡා කිහිපයකින් පසුව යෝජිත ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සඳහා මූලික සැලැස්මේ "ආරම්භක වාර්තාව" (Inception Report) සකස්කර අතිගරු ජනාධිපති තුමන්ගේ උපදෙස් සඳහා 21.10.2022 දින ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලදී. මෙම ආරම්භක වාර්තාව මගින් ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව පිළියෙළ කිරීමේ සැලැස්ම, එමගින් ආවරණය වන විෂය පථයන් සහ අධ්‍යාපන අංශය නියැදියක් ලෙස භාවිතා කරමින් සකස්කරනු ලැබූ මූලික සැලැස්මක් සාරාංශ ගතකොට ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව 21.10.2022 දින ජනාධිපති ලේකම්තුමන්වෙත බාරදෙන ලදී. (ආරම්භක වාර්ථාවේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.) තවද, ජනාධිපති ලේකම් විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දුන් උපදෙස් පරිදි, අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සහ පුද්ගලික අංශයේ විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුව ("ආර්ථික ස්ථායීකරණ, යථාතත්වයට පත්කිරීමේ සහ වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ කමිටුව- Committee on Economic Stabilization, recovery and promotion of growth" (CESRPF)) මගින් ආර්ථික ස්ථායීකරණය, යථාතත්වයට පත්කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා

	වසර දහයක කාලය ඉලක්ක කරගනිමින් ප්‍රතිපත්ති සහිත සැලැස්මක් සම්පාදනය කිරීමට කටයුතු යොදන බැවින් සකස් කරන ලද මෙම "ආරම්භක වාර්තාව" (Inception Report) එම කමිටුව වෙත ඉදිපත් කරන ලෙස භාණ්ඩාගාර ලේකම් විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 24.11.2022 උපදෙස් ලබාදෙන ලදුව ආරම්භක වාර්තාව 2022.11.28 දින ඉහත සඳහන් කමිටුවේ අවධානය පිණිස එම කමිටුවේ සභාපති ආචාර්ය ආර්.එච්.එස් සමරතුංග මහතා වෙත ඉදිරිපත් කරන ලදී. එම කමිටුව මඟින් ලබා දෙන නියෝග වලට අනුව දස වසරක ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අදාල වාර්තාව සකස් කිරීමට නියමිත වේ. තවද, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ ප්‍රධානත්වයෙන් පවතින ජාතික සභාවේ ආර්ථික ස්ථායීකරණයට අදාළ කෙටි හා මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනාගැනීමේ අනු කමිටුව මඟින් ද ආර්ථිකය ස්ථායීකරණ සම්බන්ධයෙන් කෙටි හා මධ්‍ය කාලීන පොදු ප්‍රතිපත්ති හා වැඩසටහන් හඳුනා ගනිමින් වාර්තා සකස් කරමින් සිටී. ඉහත කරුණු සැලකිල්ලට ගෙන, ගරු ජනාධිපතිතුමන්ගෙන් / ආර්ථික ස්ථායීකරණ කමිටුවෙන් ලැබෙන උපදෙස් හා සුදුසු පරිදි දශකයක් සඳහා වූ ආර්ථික සැලැස්ම පිලියෙල කිරීමට මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනවා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

ආර්.එච්.ඩබ්ලිව්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මූදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම
2022 ජුනි 15

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් ගෙන ඇති දිගු කාලීන හා කෙටිකාලීන පියවර</u> දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා. ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් මේ වන විටත් ගෙන ඇති දිගු කාලීන හා කෙටිකාලීන පියවර. • ලියාපදිංචි වීම, බදු වාර්තා ගොනු කිරීම හා ගෙවීම සඳහා ඊ සේවා. • වත්මන් බදු කරුණු හා අනුගතවීමේ අවශ්‍යතා වෙබ් අඩවිය මගින් යාවත්කාලීන කිරීම. • බැංකු 15 ක් සමග මාර්ගගත බදු ගෙවීම් වේදිකාව (Online Tax Payment Platform (OTTP)). • බදු වාර්තා හා බදු ගෙවීම් සමීපව අධීක්ෂණය හා විස්තීර්ණ බදු විගණනය සිදු කිරීම සඳහා විශාල බදු ගෙවන්නන් ප්‍රතිව්‍යුහගත කිරීම, එක් එක් නිලධාරියෙකුට සීමිත ගොණු සංඛ්‍යාවක් වෙන් කිරීම (ගොනු 8 සිට 10 දක්වා ප්‍රමාණයක්). • අර්බුදය හමුවේ අතථ්‍ය ක්‍රමවේද (virtual) භාවිතා කිරීම. • බදු සංශෝධන, බදු වාර්තා සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සූම් තාක්ෂණය (Zoom) යොදා ගැනීම. • දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ දැනුවත් කිරීමේ වීඩියෝ ක්ලිප් හා යූ ටියුබ් මගින් වැඩිදුර දැනුවත්වීම් සඳහා පහසුකම් සැලසීම. • නිලධාරීන්ට නිවසේ සිට සේවය කිරීම සඳහා පහසුකම් සැලසීම. • බදු ගෙවන්නන් ලියාපදිංචිය, බදු වර්ග	වත්මන් බදු කරුණු සම්බන්ධයෙන් අනුගතවීමේ අවශ්‍යතා වෙබ් අඩවිය මගින් නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලැබේ. ඒ අනුව, <u>වෙබ් අඩවියේ බාගත කරගැනීම් යටතේ</u> පහත සඳහන් කරුණු ඇතුලත් කරනු ලැබේ. 1) බදු පනත් සම්මත වූ වහාම හා අදාල ගැසට් නිවේදන නිකුත් වූ වහාම. 2) ඒ ඒ පනත් සඳහා අදාල බදු වර්ගයන්ට අදාලව ලබාදිය යුතු වාර්තා, උපලේඛන හා එම වාර්තා හා උපලේඛන පිරවීමට අදාල උපදෙස් මාලාවන්. 3) ඉක්මන් මාර්ගෝපදේශ. <u>වෙබ් අඩවියේ ප්‍රකාශන යටතේ</u> 1) ඒ ඒ පනත් හා ගැසට් නිවේදන මගින් සම්මත කරගනු ලැබූ කරුණු වඩාත් පැහැදිලි කර ගැනීම සඳහා වන වක්‍රලේඛ. 2) බදු වක්‍ර- අත්තිකාරම්, පුද්ගල ආදායම් බදු වක්‍ර. 3) අර්ථනිරූපන හා නියමයන්. 4) පොදු රීති නියමයන්. <u>වෙඩ් අඩවියේ ප්‍රයෝජනවත් තොරතුරු යටතේ</u> 1) පුවත් හා නිවේදන i) මේ මගින් නිරන්තරයෙන් එක්, එක් බදු වර්ග ගෙවීම් සඳහා නියමිත දිනයන්, කාලවිජේද,බදුකේත දැනුම්දීම්. ii) අයවැය යෝජනා සම්බන්ධයෙන් දැනුවත් කිරීම. iii) බදු ගෙවන්නන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන් සම්බන්ධයෙන්

ලියාපදිංචිය, ගෙවීම් යාවත්කාලීන කිරීම්, තොරතුරු යාවත්කාලීන කිරීම හා නිෂ්කාශන ලබා ගැනීම. • බදු ගෙවන්නන්ගේ ගැටළු විසඳීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංකය 1944 ක් හඳුන්වා දීම.	දැනුවත් කිරීම. iv) නව සංශෝධන හා නව පණත් සම්මත වූ පසු ඒ සම්බන්ධයෙන් සරලව දැනුවත් කිරීම. විමර්ශනය ලක් කරන ලද කාලය වන 2022.03.22 සිට 2022.07.05 දක්වා කාලය තුළ <u>පුවත් හා නිවේදන</u> යටතේ නිවේදන 24 ක් ද , 2022.07.06 සිට 2023.01.27 දක්වා පුවත් හා නිවේදන 53 ක් ද, වෙබ් අඩවියේ පලකර ඇත. (2) බදු ගෙවන්නන් සඳහා උපදෙස් මාලාව යටතේ බදු ගෙවන්නන් සඳහා උපදෙස් ලබාදෙනු ලබන ස්ථාන, ලියාපදිංචි කිරීම් , නිෂ්කාශන සහතික ලබාගැනීම යන කාර්යයන් සඳහා අදාල ස්ථාන සඳහන් කිරීම. (3) එක් එක් තක්සේරු වර්ෂයන්ට අදාලව බදු අනුප්‍රමාණ දැක්වීම සඳහා බදු වගුව. (4) එක් එක් බදු වර්ග සඳහා ගෙවීම් කිරීමට නියමිත දිනය, වාර්තාව බාරදීමට නියමිත දිනය දක්වන අදාල වර්ෂයේ බදු දින දර්ශනය. (5) අළුතින්ම වෙඩ් අඩවියට උඩුගත කරනු ලබන දැන්වීම්, අණපනත්, වෙනමම "නවතම අන්තර්ගතයන් ලැයිස්තුවක් ලෙස" දැන්වීම. <u>**වෙබ් අඩවියේ බදු වර්ග යටතේ**</u> එක් එක් බදු වර්ගය සම්බන්ධයෙන් වන යාවත්කාලීන තොරතුරු එක් එක් බදු වර්ගය යටතේ වෙන වෙනම දැක්වීම.
<u>**ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් ඉදිරියට ගනු ලබන පියවර.**</u> • නව ප්‍රතිපත්ති වෙනස්කම් සමග සමපාත වන වැඩි කරන ලද බදු පදනම්. • අදාළ බදු පනත් සඳහා සංශෝධන කඩිනමින් පාර්ලිමේන්තුවේ සම්මත කළ යුතු අතර බදු ක්‍රමයට සිදු කරනු ලබන වෙනස්කම් බදු සංශෝධනවලට අනුකූලව සිදු කළ යුතුය. මෙහි අවසන් අරමුණ වන්නේ අහිමි වූ ආදායම එකතු කර ගැනීමයි. • බදු ගෙවන්නන් හා දේශීය ආදායම් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. • කොටස් පදනම මත බදු ආදායම එකතු කිරීම අධීක්ෂණය කිරීම, විශාල බදු	<u>ආදායම් බද්ද.</u> 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් අඩුකරන ලද බදු පදනම 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධන) පණත මගින් වැඩිකරනු ලැබ ඇත. ඒ අනුව බදු පදනම තිරස්ව හා සිරස්ව වැඩිකර ඇත. එනම්, (i) තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් මිලියන 3ක් ව තිබූ පුද්ගල බදු නිදහස් දීමනාව 2023.01.01 දින සිට රුපියල් මිලියන 1.2 ක් දක්වා අඩු කිරීම. (ii) රුපියල් මිලියන 1.2 ක් ව තිබූ වියදම් සහන ඉවත් කිරීම. (iii) පුද්ගල බදු අනුපාත උපරිම අගය 18% සිට 36% වක්වා වැඩිකිරීම. 14%, 24% ලෙස තිබූ සංස්ථාපිත ආදායම් බදු අනුපාත 30% දක්වා වැඩිකිරීම සහ එක් අගයක් කිරීම.

ගෙවන්නන්ගේ අංශ, ඉහළ ඒකක හා මධ්‍යම ආයතනික ඒකක දැනටමත් පිහිටුවා ඇති අතර ඒවා තව දුරටත් ප්‍රතිව්‍යුහගත කරමින් පවතී. • හිඟ බදු එකතු කිරීමේ ක්‍රියාවලිය තව දුරටත් වේගවත් කරමින් පවතී. • බදු වාර්තා අනුකූලතාවය හා ස්වයං තක්සේරු ගෙවීම් පිළිබඳ අධීක්ෂණය අවධාරණය කිරීම. • මෑතකදී නිකුත් කරන ලද බදු තක්සේරු (2018/2019 තක්සේරු වර්ෂය සඳහා) අයකර ගැනීමට ප්‍රමුඛතාව ලබා දීම. • බදු පදනම පුළුල් කිරීම. • විගණන කාර්යය වේගවත් කිරීම හා අවදානම් පදනම මත විගණන සංඛ්‍යාව වැඩි කිරීම. • බදු අහිමිවීම් වාර්තාකරන ක්‍රියාමාර්ග සඳහා වැඩි අවධානයක් යොමු කිරීම. • මෑතකදී ලබා දෙන ලද බදු සමාවන් යටතේ ප්‍රකාශයන් කළමනාකරණය කිරීම. • බදු ආදායම වැඩි කිරීම සඳහා වෙනත් පරිපාලන ක්‍රියාමාර්ග ගැනීම.	(iv) පුද්ගල ආදායම් බදු සඳහා ආදායමේ සීමාවන් අතර අගයන් අඩුකිරීම. (v) අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හා අත්තිකාරම් ආදායම් බද්ද කැමැත්ත විමසීමකින් තොරව රඳවා ගැනීම. <u>එකතු කල අගය මත බද්ද.</u> (i) එකතු කල අගය මත බද්ද සඳහා බදු බැදියාවට යටත්වන සීමාව රුපියල් මිලියන 300 සිට 80 දක්වා අඩුකිරීම. (ii) 8% ක් වූ බදු අනුපාතය 2022.07.01 සිට 12% දක්වා ද , 2022.09.01 සිට 15% දක්වා ද වැඩිකිරීම. <u>සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද.</u> 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මක කිරීම. ඉහත බදු සංශෝධන සඳහා වන සංශෝධිත පනත් මුදල් අමාත්‍යාංශය මගින් කෙටුම්පත් කරනු ලබන අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනුයේ ඒ සඳහා නිරීක්ෂණ ලබාදීමය. (1) බදු පනත් සඳහා සංශෝධන සම්මත වූ පසු එම සංශෝධන වලට අනුකූලව ආදායම එකතු කර ගැනීම සඳහා බදුගෙවන්නන් විසින් බාරදිය යුතු වාර්තා සංශෝධනය කල යුතු අවස්ථාවන්හී දී එය සිදු කිරීම. (2) වාර්තා සම්පූර්ණ කිරීමට අදාල උපදෙස් මාලාවන් නිකුත් කිරීම. (3) බදු සංශෝධන සම්බන්ධයෙන් අදාලවන වක්‍රලේඛ නිකුත් කිරීම. (4) බදු ගෙවීම් සහ වාර්තා බාරදීම් සම්බන්ධව බදු ගෙවන්නන් දැනුවත් කිරීම සඳහා සහ යාවත්කාලීන කිරීම සඳහා වරින් වර නිවේදන නිකුත් කිරීම. ඉහත 02 හී සඳහන් කර ඇති පරිදි දැනටමත් බදු පදනම් නීතිමය වශයෙන් පුළුල් කර ඇත. බදු නිදහස් දීමනාව අඩුකිරීම, බදු නිදහස් කිරීම් ඉවත් කිරීම මගින් බදු ලිපි ගොනු ප්‍රමාණය වැඩි කිරීම මගින් බදු ආදායම වැඩිවීම. පුද්ගල ආදායම් බදු සඳහා ආදායමේ සීමාවන් අතර අගයන් අඩු කිරීම, පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු අනුපාතයන් වැඩි කිරීම, එකතු කළ අගය බද්ද සඳහා බද්දට යටත් සීමාව අඩු කිරීම හා බදු අනුපාතය වැඩි කිරීම මගින් දැනටමත් පවතින ලිපිගොනු මගින් ලැබිය යුතු බදු ආදායම වැඩිවීම. 2023 අයවැය යෝජනාවේ සඳහන් පරිදි වයස

	අවුරුදු 18 ට වැඩි පුද්ගලයන් සඳහා ලිපිගොනු විවෘත කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වමින් පවතී. 2021 අංක 18 දරන මුදල් පනත අනුව බදු අය කළ හැකි සැපයුමෙහි, ආදායමෙහි හෝ වත්කමෙහි යම් ප්‍රමාණයක් 2020 මාර්තු 31 වන දින හෝ එදිනට පෙර හෙළි දරව් නොකළ පුද්ගලයෙකුට එම වත්කම් 2022.03.31 දිනට පෙර එම වත්කමින් වෙළෙඳපළ වටිනාකම මත 1% බද්දක් ගෙවා ස්වේච්ඡාවෙන් හෙළි දරව් කිරීමට අවස්ථාවක් ලබා දෙන ලදී. ඒ අනුව, ප්‍රකාශන 4,200ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතර, ඉන් ප්‍රකාශන 3,110 මේ වන විට පිළිගෙන ඇත. බදු ගෙවන්නා දක්වන අනුකූලතාව මත ඉතිරි ප්‍රකාශන පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත. ස්වේච්ඡාවෙන් වත්කම් හෙළි දරව් කිරීම මත බදු වශයෙන් රුපියල් මිලියන 4,052 ක මුදලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එක් රැස් කර ඇත. ස්වේච්ඡාවෙන් හෙළි දරව් කිරීමට අවස්ථාවක් ලබා දෙන ලද අවස්ථාවේ දී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීමට අවස්ථාවක් සැලසීම මගින් නව ලිපිගොනු විවෘත වීම. බදු නීතිය සම්බන්ධ පැහැදිළි කිරීමේ සහ බදු වාර්තා පිරවීම සම්බන්ධ දැනුවත් කිරීම් කර බදු ගෙවන්නන් හා සියලු ජනතාවගේ දැනුවත් වීම සඳහා ඒවා "You tube" මගින් උඩුගත කිරීම.
<u>කාරක සභාවෙන් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ ප්‍රගතිය</u> ප්‍රධාන සමාගම් කිහිපයක් විසින් හිඟ බදු ආපසු නොගෙවීම, බදු අභියාචනා අදියර තුන එක් අදියරක් දක්වා අඩු කිරීම, මාස 6 ක් ඇතුළත බදු අභියාචනා විභාග කර අවසන් කිරීම හා බදු ගෙවන්නා විසින් බදු තක්සේරුවෙන් 50%ක අනිවාර්ය ගෙවීමක් කළ යුතු බවට කාරක සභාවෙන් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ ප්‍රගතිය. පැරණි පනත යටතේ (2066 අංක 10 දරන පනත) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වසර 2ක් තුළ බදු අභියාචනා විභාග කර අවසන් කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටී. එම නිසා කාරක සභාව විසින් දක්වා ඇති පරිදි වසර 5ක කාලයක් ඒ සඳහා අවසර නොලැබෙන බවත්, කාරක සභාව විසින් යෝජනා කරන පරිදි බදු තක්සේරුවෙන් 50% ක මුදලක් නොගෙවුවද, බදු ගෙවන්නා විසින් යම් ප්‍රමාණයක් බදු ලෙස ගෙවිය යුතු බවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි. විසින් ප්‍රකාශ	සඳහන් කරන ලද කරුණු ACT 10/06 හා 2021.09.13 දිනැති ලිපිය මගින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත කරුණු ඉදිරිපත් කර ඇත. නිරීක්ෂණ ලබාදීම සඳහා කෙටුම්පත ලැබී නැත.

කළේය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බවත්, නීති කෙටුම්පත් සම්පාදක විසින් ඉදිරි පියවර ගනු ලබන බවත් ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලදී. බදු අභියාචනා කොමිෂන් සභාවට සිදු කරනු ලබන සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත, කෙටුම්පත් කරමින් පවතී. <u>නිර්දේශ</u> • බදු අභියාචනා කොමිෂන් සභාව විසින් බදු අභියාචනයක් විභාග කර අවසන් කිරීමට විශාල කාලයක් ගත කිරීම හා දිගු කාලයක් තිස්සේ ප්‍රධාන සමාගම් විසින් බදු ගෙවීම පැහැර හැරීම වලක්වා ගැනීමට කටයුතු කිරීම.	
<u>ඔට්ටු හා සූදු බද්ද අය කිරීම</u> සමාගම් දෙකක් විසින් නියමිත බදු ප්‍රමාණයන් ගෙවා ඇති බවත්, බදු ගෙවීමට නොහැකි මන්දැයි හේතු දක්වන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනෙක් බදු ගෙවන්නාට නියෝග කර ඇති බවත්, එම නඩුව තවමත් අවසන් වී නොමැති බවත් ග.නි. ප්‍රකාශ කළේය. <u>නිර්දේශ</u> • හිඟ බදුවල ඉතිරි ප්‍රමාණය අයකර ගැනීම සඳහා විකල්ප යාන්ත්‍රණයක් සකස් කිරීම.	• Marina Colombo Rank Entetainment Holding හා Star Dust Rank Entetainment Holding යන සමාගම් (සමාගම් දෙකෙහිම වගඋත්තරකරුවන් ලෙස දක්වා ඇත්තේ එකම අය වේ.) විසින් ආයතනයේ අධ්‍යක්ෂවරුන් වෙත සිතාසි නිකුත් කිරීම නිවැරදි නොවන බවට විරෝධතා ඉදිරිපත්කර තිබූ අතර එකී විරෝධතා ප්‍රතික්ෂේපකර නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කරන ලදි. • සහතිකයේ සඳහන් හිඟ බදු මුදල නොගෙවීමට හේතු සඳහන් කරමින් ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කිරීමටත් නඩුව 2022.06.28 දින කැඳවීමටත් නියෝග කරන ලදි. • 2022.06.28 දින නඩුව කැඳවූයේ නැත. නැවත 2022.07.19 දිනට කල් ගියද එදිනද නැවතත් 2022.08.23 දිනට නඩුව කල් ගියේය. • 2022.08.23 දින වගඋත්තරකාර පාර්ශ්වය විසින් හිඟබදු නොගෙවීමට ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලදි. පැමිණිලි පාර්ශ්වයට පිළිතුරු ගොනු කිරීමට 2022.09.27 දිනය ලබාදෙන ලදි. • 2022.09.27 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු

	අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදි. 2022.11.29 දිනට නඩුවේ තීන්දුවට දින නියම කරන ලදි. තීන්දුවට පෙර කිවයුතු විශේෂ කරුණු තිබෙනම් දින 14 කට පෙර මෝසමක් මගින් කරුණු දැක්වීමට නියෝග කරන ලදි. • 2022.11.08 දින වගඋත්තරකරුවන් විසින් මෝසමක් මගින් කරුණු දක්වමින් අදාල හිඟ බද්ද වාරික ලෙස වසර 12 කදි ගෙවීමට "ගෙවීම් සැලැස්මක්" ඉදිරිපත් කරන ලදි. • 2022.11.29 දින දේශීය ආදායම් දෙපාර්තමේනතුව විසින් වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත්කර තිබූ ගෙවීම් සැලැස්ම ලිඛිතව ප්‍රතික්ෂේප කරමින් කරුණු දැක්වූ අතර ගරු මහේස්ත්‍රාත් අධිකරණය විසින් මාස 7 ක් ඇතුලත හිඟ බදු මුදල ගෙවා නිමකල යුතු බවට නියෝග කලේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම අනුව 2022.12.13 දින මුල් වාරිකය ගෙවීමට තව දුරටත් නියෝග කරන ලදි. • 2022.12.13 වැඩ බලන මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ නඩුව කැඳවූ අතර වගඋත්තරකාර සමාගම් විසින් පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් වාරික ගෙවීම සඳහා වෙනත් දිනයක් ලබාදෙන ලෙස ඉල්ලුම් කරන ලද අතර, මීලඟ දිනයේ වාරික දෙකම එකවර ගෙවීමට එකඟ විය. ඉදිරි නඩු දිනය 2023.02.24 ට නියම විය. • තත්ත්වය මෙසේ තිබියදි වගඋත්තරකාර පාර්ශ්වය විසින් ගරු මහේස්ත්‍රාත් අධිකරණය විසින් ලබාදී තිබූ තීන්දුවට එරෙහිව නඩු අංක HC/RA/133/22 හා HC/RA/134/22 යටතේ ප්‍රතිශෝධන අයදුම්පත්‍රයක් බස්නාහිර පළාත්බද මහාධිකරණයට ඉදිරිපත්කර ඇත. මෙම ප්‍රතිශෝධන අයදුම්පත්‍රය මගින් මහේස්ත්‍රාත් අධිකරණය මගින් 2022.05.31 දින ලබාදී තිබූ නියෝගයත් 2022.11.29 දින ලබාදී තිබූ නියෝගයත් ඉවත දමන ලෙස සහ/ හෝ ප්‍රතිශෝධනය කරනමෙන් ඉල්ලීම්කර ඇත. • 2023.01.31 දින ප්‍රථම වරට මහාධිකරණය මගින් නඩුව කැඳවූ අතර

	මෙම නඩුව සඳහා තමන්ට පෙනීසිටිය නොහැකි බවටත්, වෙනත් විනිසුරුවරයෙකු වෙත යොමුකරන බවටත් ප්‍රකාශ කරමින් 2023.02.13 දිනට නඩුව කල්තබන ලදි.
<u>බදු සංශෝධන මගින් අපේක්ෂිත ආදායම</u> යෝජිත එකතු කල අගය මත බදු අනුපාතයන් මේ වන විට සකස් කර ඇති බවත් , 2022 ජුලි 01 වන දින වනවිට එය ක්‍රියාත්මක වනු ඇති බවත්, විදුලි සංදේශ බද්ද මේ වන විට අයකර ගෙන යන බවත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. 2022 ඔක්තෝම්බර් 01 වෙනිදා සිට අනෙකුත් බදු ක්‍රියාත්මක වන බවත්, මෙම බදු සංශෝධන මගින් රු. බිලියන 135 ක ආදායම් වැඩිවීමක් අපේක්ෂා කරන බවත් ඔහු ප්‍රකාශ කළේය.	2022 වර්ෂයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතුරු අයවැය යෝජනා වලට අදාලව පහත දැක්වෙන බදු සංශෝධන ද සිදු කිරීමට නියමිතව පැවතිනි. 1. ආදායම් බද්ද. (i) පුද්ගල ආදායම් බද්දට යටත් සීමාව සහ අනුක්‍රමික බදු අනුපාත. (ii) සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකයන්. (iii) උපයන විට ගෙවීම් බද්දට යටත් සීමාව සහ අනුක්‍රමික බදු අනුපාත. 2. 2022 වර්ෂයේ අතුරු අයවැය යෝජනා මත එකතු කල අගය මත බද්ද සඳහා යෝජිත සංශෝධන පහත පරිදි විය. (i) එකතු කල අගය මත බදු අනුපාතිකය 8% සිට 15% දක්වා වැඩි කිරීම. (ii) එකතු කල අගය මත බද්දට යටත් සීමාව රු. මිලියන 300 සිට රු. මිලියන 80 දක්වා අඩු කිරීම. 2022 අංක 44 දරණ එකතු කල අගය (සංශෝධන) පනත මඟින් බදු අනුපාතයන් සංශෝධනය කර ඇත. ඒ අනුව 2022.06.01 සිට එකතු කල අගය මත බදු අනුපාතිකය 8% සිට 12% දක්වා වැඩි කරන ලදී. ඒ මත ආදායම 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට ලැබුන අතර 2022.09.01 දින සිට 12% සිට 15% දක්වා ඉහල දමන ලද අතර ඒ මත ආදායම 2022 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී ලැබුණි. එකතු කල අගය මත බද්දට යටත් සීමාව රු. මිලියන 300 සිට රු.මිලියන 80 දක්වා අඩු කිරීම 2022 ඔක්තෝබර් මස පළමුවන දින සිට ක්‍රියාත්මක වූවත් ඒ සඳහා වන 2022 අංක 44 දරණ එකතු කල අගය මත සංශෝධන බදු පනත 2022 නොවැම්බර් මස 14 වන දින සිට බලාත්මක වූ බැවින් ලියාපදිංචි වීම එදිනෙන් පසු සිදු කරනු ලබයි. ඒ අනුව එම සංශෝධනය මත එකතු කල අගය මත බදු ගෙවීම් ලැබෙනුයේ 2023 වර්ෂයේ ජනවාරී සහ පෙබරවාරී යන මාස වල සිටයි. 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව, 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාපිත ආදායම්

	බද්ද සඳහා බදු අනුපාතය 30% ලෙස වැඩි කිරීම. 2022.10.22 දිනැති දේශීය ආදායම් (සංශෝධන) කෙටුම්පතට අනුව තනි පුද්ගල ආදායම් බද්ද සඳහා බදු අනුපාතයන්ද 2022.10.01 සිට වැඩිවීමට නියමිතව තිබුණද, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසු, පාර්ලිමේන්තුවෙන් සංශෝධන පනත සම්මත වූ පසු එය 2023.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි වැඩිකර ඇත. මේ මගින් ලබාගත හැකිව තිබූ ආදායමට යටත්ව හා සමාජ ආරක්ෂණ බද්ද 2022.09.01 ක්‍රියාත්මක වීමට තිබුණද එය ක්‍රියාත්මක වීම 2022.10.01 දක්වා කල්යාම නිසා ලබාගත හැකිව තිබූ ආදායමට යටත්ව 2022 වර්ෂයේ ආදායම් ඉලක්ක සපුරා ඇත.
<u>සමාජ ආරක්ෂණ දායක බද්ද.</u> <u>නිර්දේශ</u> • මෙම බද්දේ අවසන් බදු බර පාරිභෝගිකයා මත පැටවෙන බැවින් හා අපේක්ෂිත ආදායම රජයට එකතු කර ගැනීමට නොහැකි වන බැවින් අත්‍යවශ්‍ය භාණ්ඩ මෙම බද්දෙන් නිදහස් කිරීමේ හැකියාව ප්‍ර.ග.නි. විසින් සොයා බැලීම.	දැනටමත් 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛණයේ 1අ කොටස මගින් හා 1ආ කොටස මගින් නිදහස් කරන ලද ද්‍රව්‍ය ද, 11 කොටස මගින් නිදහස් කරන ලද සේවාද, දක්වා ඇත. තවද, දෙවන උපලේඛනය මගින් බද්දට යටත් පිරිවැටුමේ කොටස (ප්‍රතිශතය) දක්වා ඇත. මෙය 2022 අයවැය යෝජනාවන් හි ඇතුලත්ව තිබූ යෝජනාවකි. 2022.06.21 දිනැති කෙටුම්පතට අනුව, 2022.07.01 දින සිට ක්‍රියාත්මකව විය යුතුව තිබුණි. නමුත් ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ 2022.10.01දින සිටය. එමෙන්ම, ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන 140 ක් විය. 2023.02.03 දින වන විට මධ්‍යම ලේඛණ කළමනාකරණ අංශය වෙත ලද සමාජ ආරක්ෂණ දායක බදු වාර්තා ගණන 2,293 ක් වන අතර වාර්තා මත සඳහන් බදු ප්‍රමාණය රු. 4,300,899,407.63 ක් පමණ වේ. 2022 වර්ෂයට අදාලව 2022 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද රැස් කර ඇත. මේ අනුව 2022 වර්ෂයේ අතුරු අයවැය මඟින් යෝජිත බදු සංශෝධන ප්‍රකාරව 2022 වර්ෂයේ ආදායමට සෘජුවම බලපාන ලෙස ක්‍රියාත්මක වූ යෝජනා නම් 1. එකතු කල අගය මත බදු අනුපාතිකය 8% සිට 15% දක්වා වැඩි කිරීම. 2. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම. මෙම යෝජනා මත අතිරේකව රු. බිලියන 117 ක පමණ අතිරේක ආදායමක් ලබා ගැනීමට 2022 වර්ෂය අවසාන වන විට හැකි විය.

<u>එකතු කල අගය මත බද්දේ බලපෑම.</u> සමාජ ආරක්ෂණ බද්ද මෙන් නොව එකතු කල අගය මත බද්දේ බදු බර කිහිපවරක් පාරිභෝගිකයා වෙත පැටවීමේ බලපෑමක් නොමැති බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.	එකතු කළ අගය මත බද්දේ බදු බර කිහිපවරක් පාරිභෝගිකයා වෙත පැටවීමේ බලපෑමක් නැත.
<u>හිඟ බදු එකතු කර ගැනීම සඳහා පියවර.</u> රු.බිලියන 169 ක් වන RAMIS හා LEGACY පද්ධති යටතේ වන හිඟ බදු එකතු කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර. 2022 මාර්තු මස වන විට බිලියන 15 ක් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව ග.නි. ප්‍රකාශ කළේය.	2022.12.31 දිනට LEGACY පද්ධතියට අදාළ හිඟ බදු වලින් රු. 45,557,020,546.00 ක මුදලක් ද RAMIS පද්ධතිය යටතේ රු. 12,109,479,896.00 ක මුදලක් ද අයකර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව, 2022 වර්ෂය සඳහා මුළු එකතුව වශයෙන් රු. 57,666,500,442.00 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර ඇත.
<u>රජය මගින් විශාල බදු සහන ලබාදීම.</u> • රජයට අහිමි වන ආදායම හා විශාල බදු සහන ප්‍රදානය කිරීම හේතුවෙන් ආර්ථිකයට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳව රජයට දන්වා සිටීමට පියවරක් ගෙන නොතිබීම මෙම තීරණය හේතුවෙන් රටට ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල පිළිබඳව මුදල් අමාත්‍යාංශයට දන්වා තිබූ බව ග.නි. ප්‍රකාශ කළේය.	සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ගන්නා ලද කැබිනට් තීරණ මත හා පාර්ලිමේන්තුවෙන් සම්මත කර අදාළ බදු සංශෝධන සිදුකර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩී.ආර්.එස්. හපුආරච්චි
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02.

දෙපාර්තමේන්තුවේ නම : බදු අභියාචනා කොමිෂන් සභාව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම

2022 ජූනි 15

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
<u>කාරක සභාවෙන් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ ප්‍රගතිය</u> ප්‍රධාන සමාගම් කිහිපයක් විසින් හිඟ බදු ආපසු නොගෙවීම, බදු අභියාචන අදියර තුන එක් අදියරක් දක්වා අඩු කිරීම, මාස 06ක් ඇතුළත බදු අභියාචනා විභාග කර අවසන් කිරීම හා බදු ගෙවන්නා විසින් බදු තක්සේරුවෙන් 50%ක අනිවාර්ය ගෙවීමක් කළ යුතු බවට කාරක සභාවෙන් නිකුත් කළ නිර්දේශ සම්බන්ධ ප්‍රගතිය පැරණි පනත යටතේ (2006 අංක 10 දරන පනත) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වසර 2ක් තුළ බදු අභියාචනා විභාග කර අවසන් කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටී. එම නිසා කාරක සභාව විසින් දක්වා ඇති පරිදි වසර පහක කාලයක් ඒ සඳහා අවසර නොලැබෙන බවත්, කාරක සභාව විසින් යෝජනා කරන පරිදි බදු තක්සේරුවෙන් 50%ක මුදලක් නොගෙවිවද, බදු ගෙවන්නා විසින් යම් ප්‍රමාණයක් බදු ලෙස ගෙවිය යුතු බවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ග. නි. විසින් ප්‍රකාශ කළේය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බවත්, නීති කෙටුම්පත් සම්පාදක විසින් ඉදිරි පියවර ගනු ලබන බවත් ප්‍ර.ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. බදු අභියාචනා කෙමිෂන් සභාවට සිදු කරනු ලබන සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත, කෙටුම්පත් කරමින් පවතී. <u>නිර්දේශ</u> - බදු අභියාචනා කොමිෂන් සභාව විසින් බදු අභියාචනයක් විභාග කර අවසන් කිරීමට විශාල කාලයක් ගත කිරීම හා දිගු කාලයක් තිස්සේ ප්‍රධාන සමාගම් විසින් බදු ගෙවීම පැහැර හැරීම වලක්වා ගැනීමට කටයුතු කිරීම.	2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව කොමිෂන් සභා සාමාජිකයින් 9ක් සහිතව කමිටු තුනකින් සමන්විත විය යුත බව දක්වා තිබේ. එහෙත් කොමිෂන් සභාව ආරම්භයේ සිට 2019 වර්ෂය දක්වාම සභාපතිතුමා ඇතුළුව සාමාජිකයන් 2ක් පමණක් පත්වීම් ලැබ එක් කමිටුවක් පමණක් ක්‍රියාත්මක විය. 2020.01.01 දින සිට 2022.07.02 දක්වා කොමිෂන් සභා පනතට අනුකූලව කොමිෂන් සභා සාමාජිකයන් 9 දෙනාම සහිතව කමිටු 03 ම සක්‍රියව පැවතුණි. බදු අභියාචනා කොමිෂන් සභා සභාපති ඇතුළුව 5 දෙනෙකුගේ ධුර කාලය 2022.07.02 න් අවසන් විය. නැවත 2022.09.01 දින සිට කමිටු සාමාජිකයින් 9 දෙනෙකු පත් කළ අතර 2022.09.20 දින සිට කමිටු 3ම ක්‍රියාත්මක වේ. ඒ අනුව, කමිටු 3ම සතියට සිදු කරන රැස්වීම් වාර ගණන ඉහළ දැමූ බැවින් සහ එක් රැස්වීම් වාරයක දී විමසීමට ගන්නා නඩු ගණන ද ඉහළ දැමීම මගින් ද 2021 වසර දක්වා ලියාපදිංචි වූ බදු අභියාචනා විමසීම් මේ වන විට ආරම්භ කර ඇත. 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා සංශෝධිත පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොමිසමට සහාය වීම සඳහා සාමාජිකයන් 10 දෙනෙකුට නොවැඩි මූලමණ්ඩලය නමින් හඳුන්වන උපදේශක මණ්ඩලයක් සිටිය යුතුය. දිගු කලක් පුරප්පාඩු වූ මෙම තනතුරු 2022.12.12 දින සිට පිරවීමට කටයුතු කර ඇති අතර ඒ අනුව නීති උපදේශක සාමාජිකයන් 08 දෙනෙකු පත් කර ඇත. උපදේශන සභාවේ සාමාජිකයන් සම්පූර්ණ කිරීම තුළින් ද බදු අභියාචනා තීරණ කඩිනම් කිරීමට හැකිවිය. බදු අභියාචනා නඩු තීන්දු යතුරු ලියනය කිරීම කඩිනම් කිරීම සඳහා 2022 වර්ෂයේ දී අළුතින්

	අනුමත කර ගත් සංවර්ධන නිලධාරී 05 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු අද වන විට පුරවා ඇත. ඒ තුලින් ද බදු අභියාවනා තීන් දු ප්‍රකාශ කිරීම කඩිනම් කිරීමට හැකි වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා බදු අභියාවනා කොමිෂන් සභාවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ලේකම්
බදු අභියාවනා කොමිෂන් සභාව

වී. වී. හෙට්ටිආරච්චි
ලේකම්
බදු අභියාවනා කොමිෂන් සභාව
නො. 35, ලේක්හවුස් ගොඩනැගිල්ල,
දෙවන මහල, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 182

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ කොරතුරු ඉදිරිපත් කිරීම.

වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් සකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභා රැස්වීම

2022 ජූනි 15

වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
සමාජ ආරක්ෂණ දායක බද්ද පිළිබඳ නිර්දේශ මෙම බද්දේ අවසන් බදු බර පාරිභෝගිකයා මත පැටවෙන බැවින් හා අපේක්ෂිත ආදායම් රජයට එකතු කර ගැනීමට නොහැකි වන බැවින් අත්‍යවශ්‍ය භාණ්ඩ මෙම බද්දෙන් නිදහස් කර ගැනීමේ හැකියාව ප්‍ර.ග.නි විසින් සොයා බැලීම	- ඖෂධ ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ දැනටමත් සමාජ ආරක්ෂණ දායක බද්දෙන් නිදහස් කර ඇත. - ආදායම් අහිමි වීම වැළැක්වීම සඳහා සමාජ ආරක්ෂණ දායක බද්ද සඳහා ලබා දී ඇති නිදහස් කිරීම් අවම මට්ටමක පවත්වා ගෙන ඇත. - විවිධ බදු ගෙවන්නන්ගේ කාණ්ඩ අනුව බදුකරණය සඳහා වෙනස් පදනමක් යොදා ගැනීම මඟින් නිෂ්පාදන දාමයේ සෑම අදියරකදී ම මෙම බද්ද අදාළ වීම නිසා ඇති වන බලපෑම (cascading offect) අඩු කර ඇත. - උදාහරණයක් වශයෙන් බෙදාහරින්නන්ගෙන්, පිරිවැටුමෙන් සියයට 25 ක් සඳහා බදු අයකරනු ලබන අතර, තොග වෙළඳාමේ හා සිල්ලර වෙළඳාමේ නිරත තැනැත්තන්ගේ පිරිවැටුමෙන් සියයට 50 ක් සඳහා ද බදු අය කරනු ලබයි. - කෙසේ වුවද, විවිධ පාර්ශ්වකරුවන්ගෙන් ලැබුණු ඉල්ලීම් සළකා බලා ඉදිරියේදී ඇතැම් භාණ්ඩ හා සේවා බද්දෙන් නිදහස්කිරීමට නියමිතය.
ආදායම් එකතු කිරීම වැඩි කර ගැනීම හා ප්‍රේෂණ ගලා ඒම වැඩි කිරීම සඳහා වූ යෝජනා - රටවල් අතර සිදු වන වාණිජ වෙළඳාම සඳහා බදු පැනවීම - විශේෂිතව හඳුනාගත් භාණ්ඩ සඳහා බදු හඳුන්වා දීම/ බදු වැඩි කිරීම උදා: පරිච්ඡේද 50-55, 58 සහ 60 යටතේ රෙදිපිළි සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) අයකිරීම	මේ සම්බන්ධයෙන් යෝජනා කිහිපයක් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් වී ඇති අතර, මුල් අදියරේ දී ක්‍රියාත්මක වන බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතා සපුරාලීමෙන් පසු මෙම යෝජනා සළකා බැලීමට නියමිතය. මේ වන විට රෙදිපිළි ශූන්‍ය අනුපාතයක් යටතේ බද්දට යටත් වේ. මෙය ඉදිරියේ දී සිදු කිරීමට නියමිත එකතු කළ අගය මත බද්ද සඳහා ලබා දුන් නිදහස් කිරීම් සමාලෝචනය කිරීම යටතේ සළකා බලෙනු ඇති අතර, එම සහනය ඵලදායී නොවන්නේ නම්, ඉදිරියේ දී ඉවත් කෙරෙනු ඇත.

සළකා බැලීම. පවතින තීරු බදු ව්‍යුහය, බර අනුව අදාළ වන සෙස් (CESS) බද්දකින් සමන්විත වන බැවින් මෙම කාණ්ඩ සාමාන්‍යයෙන් වැඩි අගයක් ගනු ලැබේ.	

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 182 සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආචාර්ය එම්.කේ.ඩී. සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.